

# ආත්ම ප්‍රත්‍යවේක්ෂණය

බෝසතාණන් වහන්සේ බුදුවීම දක්වා බෝධි චිත්තය විසිතුරු කර ගත්තේ පාරමී සිත එළිය කර ගත්තේ ආත්ම ප්‍රත්‍යාවේක්ෂණයෙනි. බුද්ධ භූමිය නමින් පැහැදිලි වන උට්ඨාන උම්මග්ග-අවත්ථාන-හිතචරියා යන කරුණු නිශ්චය කරගෙන බෝධි කාරක ධර්මයන් සම්පූර්ණ කළ උන්වහන්සේ කිසි කලෙකත් බුදුවනතුරු බුදුකමේ වැඩ අඩු කෙලේ නැත, දැන් ඇත කියා සෑහීමට පත්වූයේ නැත, කරදර බාධක පීඩාවන නිසා පසු බැස්සේ නැත.

අචාරශීලි තත්වය එනම් පාරමී සිත් ළිය නොනිවා රැක ගැනීම, උපදවාගත් බෝධි කාරක ශක්තිය පිරිහෙන්නට නොදී පරිස්සම් වීම බෝසත් පැවැත්මේ නොවෙනස් ලක්ෂණය වේ. බාහිර දෙය ලොකුවට ගත් සාමාන්‍ය ලෝකයා ධර්මය නොතකා බාහිර ආමිස දෙයටම දඟලන නමුත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වය උදෙසා සියල්ල පරිත්‍යාග කළ සේක. මෙසේ ආත්ම ප්‍රත්‍යාවේක්ෂණයෙන් ජීවිත පැවැත්මේ ඇතුළ බල බලා මිහිර විඳ විඳ ශාන්ති පෙරහැර පෑ බුදුරජාණන් වහන්සේ අපට සරණයි! උන්වහන්සේ සිහි කරමින්, උන්වහන්සේ වැඩිය ශාන්ති මාර්ගයේ සැනසුම් කණුව ලැබෙනතුරු නොනැවතී යාම අපේ ප්‍රාර්ථනාවන් අධිෂ්ඨානයන් විය යුතුය.

නවත් අවුරුද්දක් ගෙවී ගියේය. මේ කාල සම්මුති ඇති වන්නේ ජීවිත කාර්ය අවධි නියමයන් වශයෙනි. කාලය ගෙවී යන්නේ අපත් ගෙවා ගෙනය. අපය කීවේ සියලු සංස්කාරකයන්ය. කාලය ගෙවෙද්දී නොගෙවී ඉතිරි වන කිසිම සංඛාරයක් නැත. මේ නා නා භාවය ගැන අප දුක් විය යුතු නෙවේ. මෙය අනිවාර්ය සර්වත්‍රව්‍යාපී තත්ත්වයක් හෙයිනි. මෙය නියම විධියෙන් දැක ගැනීමට එළියක් නොලැබීම නිසා අප මෙතෙක් කල් දුක්වීමු. අද අපට ඒ එළිය ලැබී තිබේ. ඒ බුදු එළියයි අපේ ජීවිත ගමනේ සෑම පියවරක්ම නොගෙවෙන මහිමයට හරවා ගත යුත්තේ බුදු එළියෙනි. මේ ආධ්‍යාත්ම දර්ශනයෙන් ගෙවී ගිය අවුරුද්දේ නොගෙවෙන මහිමය දකිමින් ඉදිරි ගමනේ උනන්දුව වඩා ගැන්ම සුදුසුය. දුබලකම්හි ආයති සංවරයද, ආත්ම ප්‍රත්‍යවෙක්ෂණයෙහි ආනිසංස ඵලයකි.

අපේ යෝගාශ්‍රම වැඩ පටන්ගෙන අවුරුදු විස්සක් පිරී තිබේ. පුරා අවුරුදු විස්සක් අතර නැර අපි මහා සටනක යෙදුනෙමු. ඒ බුදු සසුන රැක ගැනීමේ ශාන්ති සටනය. දුක් ගමනක් වූ දීර්ඝ සංසාර ගමන ගැන සළකන විට, දුක් ඉවර කර ගැනීමේ අවුරුදු විස්සක ධර්ම ගමන සැනසිලි ප්‍රාතිහාර්යයක් හැටියට සිතට දැනී යන්නේය. මෙය පුංචි දෙයක් නොවෙයි. ලොකු සපන්කමෙකි. කිසි ආමිස බලාපොරොත්තුවක් නැතිව නිරාමිස ධර්ම ප්‍රාර්ථනාවෙන්ම පත්ව ඇති මේ සසුන් පෙරහැර ආපසු බලා සැනසෙන්නට සුදුසුව ඇත. මෙයට එක් වූ ගිහි-පැවිදි පින්වත් මණ්ඩලය මට දැනෙන්නේ මැණික් වැලක් ලෙසිනි. මැණික් එක්තැන් වුනාම මැණිකෙන් මැණික පැහැගැන්වී බැබැළීම දියුණු වන්නේය. අපේ සත්පුරුෂ එකතුවක් බැබැළුනේ එලෙසිනි. ඒ ධර්ම ප්‍රීතිය විඳගැනීමටත් ඉදිරියේ සසුන් වැඩ සඳහා වැඩි උනන්දුවක් හදා ගැනීමටත් ප්‍රීති පුණ්‍යෝත්සවයක් පැවැත්වීමටත් නියම කරගෙන තිබේ. මෙය ධර්ම මංගලයක්ම වේවා!


මා හිමිගේ ලිපි ගොනුවෙනි.



# ආත්ම ප්‍රත්‍යවේක්ෂණය

SELF REFLECTION

# "සත්පුරුෂයන් උද්යෝගිමත් කළ ඓතිහාසික ලිපිය"




2520.02.17
1977

ශ්‍රී බුද්ධ වර්ෂ 2493 වෙසක් පොහෝ දින (1949 මැයි 1) සිළුමිණ පත්‍රයේ ප්‍රධාන පිටුවෙ පළවූ "තැග්ගට සුදුසු වෙසක් සැරසිල්ල" බුදුරජාණන් වහන්සේ මනාව හඳුනාගත් බුද්ධාංකුරයන් වහන්සේ නමකගේ බෝධි චින්තනයෙන් සැපයුණු ඓතිහාසික ලිපියකි.

සුපේශල ශික්ෂාකාමී සංඝ පීතෘෂන් වහන්සේලා සහ දහස් ගණන් සත්පුරුෂ බෞද්ධ මහජනතාව මින් උද්‍යෝගිමත් වූයේ අරුණෝදයේ ළහිරු පහසින් පිපීයන පෙළක් මෙනි.

2500 සම්බුද්ධ ජයන්ති සමය උදාවත් ම, ශාසන ප්‍රතිපත්ති හා මඟ පල නිවන් වසා පැවති විමති අඳුර නසා, අදත් මඟ පල නිවන් රස විඳිය හැක්කේ මෙසේ ය යි, සම්බුද්ධ ශාසනය නගා සිටුවීමේ ප්‍රණීතාධ්‍යාශයෙන් සමාරබ්ධ "ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව" මෙම ඓතිහාසික ලිපියේ ප්‍රතිඵලයකි.

පණසකට අධික අරණ්‍ය සේනාසන, විවේක සේනාසන හා දෙසියයකට අධික සුප්‍රතිපන්න යෝගාවචර බුද්ධපුත්‍රයන් වහන්සේලා ද දස දහස් ගණන් බෞද්ධ මහජනතාව ද "තැග්ගට සුදුසු වෙසක් සැරසිල්ල" අවිානුගත කරමින් පරම ප්‍රතිපත්ති පූජාවෙන් බුද්ධ පූජා කරනනේ මේ ලිපියෙන් පටන් ගත් ශාසන සංග්‍රාමයේ මහිමයෙනි.

දෙවියන් සහිත සමස්ත සත්පුරුෂ ලෝකයාගේ අකලංක මෛත්‍රී ආශිර්වාදයට පාත්‍රවන "යථාවාදී තථාකාරී" තථාගතයන් වහන්සේට අනුව පවතින යථොක්ත බුද්ධාංකුර අතිගරු පූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශ මහා ස්වාමින්ද්‍රාතනමයාණන් වහන්සේගේ සකල සංකල්පනා සමෘද්ධ වී ඒකාන්තයෙන් බුදු බව ම ලැබේවා!

ප්‍රභින්න ප්‍රතිසම්භිද ප්‍රාප්ත මහාරහන්ත ධම්මදින්න මහරහතුන් වහන්සේ ප්‍රධාන දස දහස් ගණන් මහරහතුන් වහන්සේ වැඩ සිටි තලගුරු වෙහෙර අද ශ්‍රී කළ්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රථම අරණ්‍ය සේනාසනයකි.

වයොවෘද්ධ තපොවෘද්ධ ගුණවෘද්ධ ඥානවෘද්ධ සම්භාවනීය විදර්ශනාචාර්ය පුස්සැල්ලේ ධම්මතිලක මහෝපාධ්‍යාය ස්වාමින්‍ද්‍රාත්තමයාණන් වහන්සේ ශාසන ප්‍රතිපත්ති ප්‍රදීපස්ථම්භය වඩ වඩා බබුළුවමින් පුරා පස්විසි වසරක් තුළ නිමලව අරණ්‍ය සේනාසනය ගුණ නුවනින් ප්‍රභාවත් කරමින් වැඩ සිටිති.

අසූවිය ඉක්ම සිටි අතිගරු මාහිමිපාණන් වහන්සේට සෙත් පිණිස කෘතවේදී මහ සඟ පිරිස හා දයාබර දායක සත්පුරුෂ මණ්ඩය පෙළී වී 2520 / 1977-2-16, 17 දිනයන්හි නිමලව අරණ්‍යයේදී පවත්වනු ලබන ප්‍රණීත පුණ්‍ය පූජෝත්සවය සිහිගැන්වීම සඳහා මෙම ඓතිහාසික ලිපිය ජය කේතුවක් වේවා!

අතිගරු මාහිමිපාණන් වහන්සේට දීර්ඝායුඃ ශ්‍රී ශාන්ති වේවා!

"සතං සමාගමො හොතු - යාවනිබ්බාන පත්තියා"

මෙයට, සුවච
අරියධම්ම

# තෑග්ගට සුදුසු වෙසක් සැරසිල්ල

අද බුදුරජාණන් වහන්සේ වැඩ සිටින සේක් නම් වෙසක් සැරසිලි කාරයන්ට කෙබඳු බණක් වදරද් ද?

සිංහල බෞද්ධයන් විසින් වර්ෂයක් පාසා වෙසක් උත්සව උත්කර්ෂවත් ලෙස පවත්වනු ලැබේ. ජාතික සාමායික දෙපයින්ම විශේෂ සිද්ධි රැසක් සිහියට නංවන වෙසක් දිනයෙහි උත්සව පැවැත්විය යුතුම ය. අප මේ ලිපිය ලියන්නේ වෙසක් ඉතිහාසය දැක්වීමට හෝ උත්සව කරුවන්ගේ උනන්දුව පණපෙවීමට නො වෙයි.  දැන් පවත්වාගෙන යන වෙසක් උත්සවයේ අංගෝපාංග වශයෙන් තහවුරු වී පවත්නා ක්‍රියා විවිධ උත්සව පරමාර්ථයට හොබින්නේ ද යනු සිහි ගැන්වීමට වෙසක් බෞද්ධයන් නවතා ගැනීම අපේ අදහසයි. වෙසක් කාලයට පමණක් බොදු පුබුදුව දක්වන පිරිසක් මට පෙනෙන හෙයිනි, වෙසක් බෞද්ධයන් ය යි සඳහන් කෙළේ බලවත් පරිශ්‍රමයකින් මහත් වියදමකින් ඔබ කරන භක්ති පූජාව අර්ථවාහී නො වේ නම් එය ප්‍රඥාගෝචර වන්නේ කෙසේ ද? මෙහි හිත යොදවනු මැනවි.

ඇඳුම් කොතරම් අලංකාර වුවත් ශරීරයට නො ගැළපේ නම් වැඩක් නැත. සිතුවම් කොතෙක් විසිතුරු වුවත් වස්තුවට නො සෑහේ නම් අස්ථානගතය. රචනය කොතරම් සිලිටි වුවත් උපනාසිතය නො විසාද් නම් නිරර්ථක ය. උත්සවය කොතරම් සුන්දර වුවත් පරමර්ථය භ්‍රෂ්ට නම් අප්‍රශස්ථ ය. වෙසක් උත්සවයේ පරමාර්ථය බුදු රජාණන් වහන්සේට භක්ති පූජා පැවැත්වීම යි. ඒ භක්ති පූජා උන් වහන්සේගේ චරිතයට උන් වහන්සේගේ අනුශාසනයට උචිත සේ පැවැත්වුව හොත් පමණි, ගෞරව සහගත වනුයේ, බුද්ධ චරිතයට බුද්ධානුශාසනයට නො ගැළපෙන බහු වැඩ වලින් බුදුන් පුදන්නට යාම විචාරශූනය මෝඝ ප්‍රයන්තයක් කොට සැලකිය යුතු ය. අද අපේ බුදු රජාණන් වහන්සෙ වැඩ සිටින සේක් නම් මේ උත්සවාකාරයන්ට හොඳ ම බණක් දෙසනවා ඇත.

"මේ නැටුම් නටන්නෝ මා පුදන්නෝ නොවෙති"

දෙව් මිනිසුන්ගේ පුද පෙරහැර ලබන්නට, දෙවියන් මිනිසුන් නටවන්නට උන් වහන්සේ බුදු නො වූ වග අන්තිම පැයේදී පහදා වදාළ සේක. පිරිනිවන් ඇඳෙහි වැදහොත් බුදු රජාණන් වහන්සේට පූජා පිණිස දිවාමය නැටුමක් පවත්වන්නට දෙව් නළු පිරිසක් පැමිණය හ. එයට අවකාශ දුන මැනවැ යි ආනන්ද ස්වාමින් වහන්සේ කළ යැදුම පිළිකෙව් කරමින් බුදු රජාණන් වහන්සේ මෙසේ වදාළ හ. ආනන්දය! මෙහි නැටුම් නටන්නෝ මා පුදන්නෝ නොවෙති, ඉදින් යමෙක් ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් ආත්ම සංයමය කෙරේ නම් හෙතෙමේ ම මා පුදන්නේ වෙයි. බුදු රජාණන් වහන්සේ උන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් කවර පිදුමක් අපේක්ෂිත වූ සේක් ද? යනු සක්සුදක් සේ මෙයින් පැහැදිලි වන්නේ ය.

ලුණු නැති කුඩු කැවුම් සන්තෝෂයෙන් වළඳන්නට තරම් අල්පෙච්ඡ වූ ද, ඉෂ්ටානිෂ්ට ආලම්බණයෙහි මැදහත් පැවතුමෙන් අනාසනත ශාන්ත වූ ද, බුදු රජාණන් වහන්සේ ස්වකීය ශ්‍රාවකයන්ට ආදර්ශයෙන් ද අනුශාසනයෙන්ද පහද වදළේ බාහිර ආටෝපයට නො රැවටී අධ්‍යාත්මික පාරිශුද්ධිය උපදවා ගන්නා
ලෙස ය. උන් වහන්සේ විසින් ප්‍රඥප්ත සියලු ශික්ෂාවෝ ඉන්ද්‍රිය සංයමයෙන් ආත්ම විජය සලසන්නාහු වෙති. ක්ලේශ ශමථය පිණිස එක එල්ලේ හේතු භූත ප්‍රතිපත්ති සංදශීක බුද්ධ ධර්මය සමාක් දර්ශනය පදනම කොට ඇත්තේ ය. තදනුගත වූවාහු බුද්ධ ප්‍රශස්ත වූ හ. තදතිකාතකයෝ බෞද්ධ සමාජයේ සාමාජිකත්වයට නුසුදුස්සෝ ය. එබන්දෝ බුදු රජාණන් වහන්සේගේ අන්ත නිග්‍රහයට ලක්වූවාහු වෙති.

බුද්ධ කාලයෙහි ප්‍රතාපන්තවාසී එක් භික්ෂු නමක් අමාර්ග ප්‍රතිපත්ති හේතුවෙන් බුද්ධ නිග්‍රහයට ලක් වූ දහසක් දෙනාගෙන් කෙනෙකු වශයෙන් දැක්විය හැකි ය. නිරතුරු මටසිළුටු සිවුරු පිරිකරෙන් සැරසීගත් ඒ භික්ෂුන් මහත් පරිශ්‍රමයෙන් කෙළේ ස්වකීය ආරාමය දියුණු කිරීම ය, මේ සැරසුම් ජීවිතය ගැන බුදු රජාණන් වහන්සේගෙන් තුති පැසසුම් ලැබේ ය යි ඒ භික්ෂුව කල්පනා කෙළේ ය. එහෙත් පැසසුම් වෙනුවට
බුදු රජාණන් වහන්සේ ඒ භික්ෂුවට කෙළේ මහත් සේ නින්ද කිරීම ය. කටයුත්ත පසෙක ලා අකටයුත්තෙන් ක්ෂණ සම්පත්ති කාලය මකා දමන තුච්ඡ පුරුෂයෙකැ යි අතිශයින් නිග්‍රහ කළ සේක, තමන්ගේ අගුණ ශීලය භික්ෂුවට හොඳින් වැටහිණ. අද බුදු රජාණන් වහන්සේ වැඩසිටින සේක් නම් අපේ වෙසක් සැරසිලි කාරයන්ට හොඳ බණක් දෙසනු ඇතැයි මා සඳහන් කෙළේ මෙවැනි පුවත් සිහියට නැගීමෙනි.

"ප්‍රතිපත්ති පූජාව පස්සට දැමීම"

බුදු රජාණන් වහන්සේ වෙනුවෙන් විසිතුරු තොරන් බැඳගෙන, මාලාකර්ම ලතාකර්ම ආදියෙන් ගේ දොර මග දෙපස මොනවට සරසාගෙන, නා නා විසිතුරු පහන් පන්දම් දල්වා ගෙන වෙසක් පූජාව පවත්වන මේ භක්තිමතුන්ගේ සිත ඇතුළත ප්‍රතිපත්ති පූජාවෙන් ඇති වන සැරසිලි ප්‍රභාවත් ද? වෙසක් සැරසිලි බලමින් වෙසක් දින විනෝද චාරිකාවේ හැසිරෙන පින්වතුන් පුරන්නේ කවර ශීලයක් සමාධියක් දැ යි නො දනිමි.  අවුරුදු පතා මේ සැරසිලි පින්කම් වගා කරන්ට තෑගී බෝග දෙමින් ගුණ වනමින් පොහොර හෙළන්නෝ ද දක්නා ලැබෙත්.

ගම්බද මිනිසුන් වෙසක් බැලීමට නගරයට ඇදී යාම නිසා වෙසක් දින විහාර පන්සල් අඳුරෙහි ය. කරන්නට වැඩක් නැති නිසා පිළිමගෙහි දොර වසා දමා පන්සලේ හාමුදුරුවෝ ද වෙසක් බලන්නට නො ව දායකයන් බලන්නට නගරයට වඩිති. එක් වෙසක් දිනක පිටිසරබද ප්‍රසිද්ධ ආරාමයෙක්හි ධර්මදේශනාවක් සඳහා ගිය මට එහි දක්නට ලැබුණේ බාගෙට පණ ගිය උපාසක උපාසිකාවන් හත් අට දෙණෙක් පමණකි. සෙස්සෝ වෙසක් බලන්නට බැහැර ගොස් ය. මේ සැරසිලි ප්‍රදර්ශනය කරන්නන්ගේ ද, සැරසිලි බලන්නන්ගේද ඇතුළත වැඩෙන ගුණ දහම් මොනවා ද? ඊර්ෂ්‍යා- ක්‍රෝධ- මාන- මාත්සර්‍යාදි පාපචේතනා වඩවන නිස්සාර වැඩවලින් කරන භක්ති පූජාව බුදුරජාණන් වහන්සේට කිසි සේත් නො ගැළපේම ය.


නැති එදිරිවාදුකම් ඇතිකර ගන්නෝ


කපටි කම් බෙදගෙන වෙසක් සැරසිලි කරන්නට ගොස් කැති පොලු හටන් කරගත් ගම්මානයක් ගැනත් දෙපිල බෙදී වෙසක් සැරසිලි කිරීමෙන් ජන්මාන්තර එදිරිවාදුකම්  හදගත් කඩවිදියක් ගැනත් මම දනිමි. පිවිතුරු හැඟුමෙන් නියම තේරුමෙන් නිසි පරිදි වෙසක් පූජාවට බසින්නේ මෙවැනි අවාසනාවන්ත සිදුවීම් පිළිබඳ නො මිහිරි වේදනා විඳින්නට නොලැබෙනවා ඇත. මායා සගගත බොරු පෙන්වීම්වලින් බෞද්ධ පරමාර්ථය වැළහී යන්නේ ය. අපේ ධර්මානුශාසකයන් - සමාජ සෝධකකයන් මේ ඇන්නෑ වැඩට ආවඩනු දැක්ම වඩාත් සංවේගජනක ය. බුද්ධානුශාසනයට ගැලපෙන සේ වෙසක් උත්සව සැලැස්ම ඉදිකර ගත යුතු ය. ඇතුළත ඇවිලගත් ගෙයක් පිටතින් සුණු පිරියම් කරන්නාක් මෙන් සන්නිපාත රෝගියෙකු ආයිත්තමින් සරසන්නාක් මෙන් කරන බහිර සැරසිල්ලෙන් වැඩක් නැත. කෙලෙස් ගිනි නිවන - කෙලෙස් ලෙඩ සංසිඳුවන වැඩ වලින් ම වෙසක් උත්සවය අර්ථානුගත කල යුතු ය.

ගිලානොපස්ථානය - අනාථ සංග්‍රය ආදි කරුණා සිත වැඩෙන වැඩවලින් හා පෙහෙවස් සමාදනයෙන් බුද්ධානුස්සති ආදි භාවනාවක යෙදි විවේකව සිටිම වැනි නුවණ මෝරන පිළිවෙතින් වෙසක් රසය විඳගන්නට කල්පනා කරන්නේ නම් මැනවි. දහස් ගණන් වියදම් කිරීමෙන් මහත් වෑයමෙන් කරන බාහිර සැරසිල්ලට වඩා, කිසි වියදමක් වැඩි මහන්සියක් නැති ව ගුණදම් වගාවෙන් කෙරෙන ආධ්‍යාත්මික සැරසිල්ල උතුම් වන්නේ ය.

තෑග්ගට සුදුසු වෙසක් සැරසිල්ල නම් ආත්ම විමුක්තිය ආත්ම විජය සලසා ලන ආධ්‍යාත්මික සැරසිල්ල බැව් එක්වන් සිහිකට යුත්තේ ය.

නැණ පහනින් වෙසක් සිත පහන් වේවා!





1987

දෙසැම්බර්

டிசம்பர்

DECEMBER

11 සිකුරාදා வெள்ளி Friday

# අතිගරු, පූජනීය, රාජකීය පණ්ඩිත මාතර සිරි ඤාණාරාමාභිධාන මහෝපාධ්‍යාය මා හිමිපාණන් වහන්සේ

නිවනින් නිවෙන තුරු අපේ ප්‍රණිධිය විය යුත්තේ අප බ්‍රහ්ම තත්ත්වයට පත්වීමයි. බ්‍රහ්ම විහරණයට යි. බ්‍රහ්ම සුබ වින්දනයට යි. එය මීළඟ ජීවිතයේදී නො ව මේ ජීවිතයේදීම ය. ඇඟවල් වශයෙන් නොව චිත්ත පරිණාම වශයෙනි. කරුණාවෙන්, මෛත්‍රියෙන් අපේ සිත් සිහිල් කර ගෙන, නිවාගෙන ඒ නිවීම, සැනසීම අපේ හුස්ම බින්දුවක් පාසා එක්වන සේ අප ක්‍රියා කරන්නට පටන් ගතහොත් මොන තරම් සැපයක් ද? අප සකසා ගත යුතු වින්දනීය බ්‍රහ්ම තත්ත්වය මෙය යි. "තිට්ඨං චරං නිසින්නොවා" යනාදීන් කරණීය මෙත්ත සූත්‍රයෙහි සඳහන් වන්නේ මෙත් පෙරහැරේ නිරන්තර ස්වරූපයයි. අප අපේ ම සිත් දෙස බලා සැනසෙන්ටත් ඒ සැනසුම අපට පැ‌ගෙන වැලි කැටයට පවා කැවී යන සැටි දැක ගන්නටත් භාවිත වී නම අපට යෙදිය හැකි සමාපත්ති තත්ත්වය නෙවේ ද?

අතිගරු මහෝපාධ්‍යාය මාහිමියන් වහන්සේට සෙත් පැතීමේ පින්කම මෙහිදී ගිහි පැවිදි දෙපසේ ම සම්බන්ධයෙන් ඉතා විසිතුරු අන්දමින් සිදුවූයේ හොඳ හිතේ සුවඳ විහිදී යන ලෙසිනි. මේ දින තුනේ ම මෙයට සම්බන්ධ වූ ඇත්තන් ධර්ම මෛත්‍රිය පැතිරවීමේ භාවනා ක්‍රමයක යෙදවීම, තමන් වැඩූ ගුණ පිළිවෙත් සිහිකර ඒ ආත්ම දර්ශනයෙන් සිතේ ධර්ම සතුට වඩා ඒ සිතින් අතිගරු මා හිමියන් වහන්සේ අරමුණු කොට සෙත් පැතීම යි. මෙය ධර්ම මෛත්‍රී විරචාරය යි. ධර්ම ජීවයෙන් යුත් සිතන අනුභස ආචාචපරූපී ය. එයින් කළ නොහැකි දෙයක් නැත. තමන්ගේ සිත දැක ගැන්මේ මෙවැනි භාවනාවක යෙදීම කවදටත් හොඳ ය. මෙහි ආධ්‍යාත්මික මහිමය සැලකිය යුත්තේ හොඳ සිත් පණ ගන්වා එකට වෙලීගෙන නො නැවතී ඉදිරියට යන සැනසිලි පෙරහැරක ස්වරූපයෙනි.

"අපේ ජීවිතය බුදු සසුන උදෙසා නිතර පූජා වූ මලක්, පහනක් මෙන් වේවා!"

සැබවින් ම අපට දුකක් නැත. අතිගරු භාවනීය ස්වාමීන් වහන්සේ වැනි උතුමන්ගේ ආදර්ශ ලබමින් ගෙවූ අවුරුද්ද බලා අප සැනසෙන්නේ ලැබූ අවුරුද්දේ ජීවිත අස්වැන්න වැඩි වැඩියෙන් සරු වේවා යන ධර්ම ප්‍රර්ථනා සහිතව ය.

අපට දැන් ගුණවත් වැඩිහිටි උතුමන් හොඳට ම හිඟ වේගෙන යයි. අභාවයට යන එවැනි උතුමන් වෙනුවට ඒ පාලුව, ඒ පාඩුව පිරිමැසීමට සුදුසු ඇත්තන් පහල නොවීම ධර්‍මීය පිරිහී යාමේ අනිෂ්ට ලක්ෂණයකැ යි කිය යුතුම ය. වැඩිහිටි උතුමා ධර්‍මීයේ අතුල්‍ය ආධාරකය වෙයි. එවැනි උතුමන් නැති වී යාමෙන් ධර්‍මීය නිරාධාර වෙයි. නිරාලම්බ වෙයි. ගුණවත් වැඩිහිටි උතුමෝ සසුන් මැදුර දරා සිටින්නෝ ය.

මා හිමිගේ ලිපි ගොනුවෙනි.







ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ඖරස පුත්‍ර, අග්‍රශ්‍රාවක, මහා ශ්‍රාවක, මහාථෙර පරම්පරවෙන් අවිච්ඡින්න සෝණුත්තර වංශයෙහි ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රථම ප්‍රව්‍රජ්‍යාභිෂේකය වෂ.ව. 1951 ජූනි 18 දිනට යෙදුණු පොසොන් පුර පසළොස්වක පෝ ද අම්බලන්ගොඩ දෙල්දූව අරණ්‍ය සේනාසනයේදී අතිගරු පූජ්‍යනීය රස්නකවැවේ ශ්‍රී සද්ධම්මවංශ අනුනායක මාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සිදු වූ ඓතිහාසික මොහොත සනිටුහන් කෙරෙන ඡායා රූපයකි ඉහළින් දැක්වෙන්නේ.



# අතිපූජ්‍ය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේගේ සංක්ෂිප්ත චරිතාපදානය

"මා සසුන මෙහි සුරැකෙන්නේ ය" යි සම්මා සම්බුදු සිරි මුවින් විවරණ ලද මේ සිරිලක සම්බුදු සසුන සවිමත් කරනු වස් පෙරුම් දම් පිරි මහා යුග පුරුෂයෝ වරින්වර පහළ වූ හ. ඒ විසිතුරු සත්පුරුෂ මිණි පහන් පෙළෙහි තවත් එක් ජෝතිමත් මිණි පහනක් වැදගත් සාසනික සිදුවීම් රැසකට පසුබිම් වූ ඇසළ පුර පසළොස්වක් පෝ දිනක නිවී ගිය බව මෙහි ලා සනිටුහන් කරනුයේ සාතිශය ශාසන සංවේගයෙනි.

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායට අනුබද්ධිත ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවෙහි සමුත්පාදක හා ප්‍රධාන අනුශාසක ශ්‍රී ආර්‍ය විලාස වංශාලංකාර සද්ධර්මවාගීශ්වරාචාර්‍ය පටිපත්ති සොභන ගණපාමොක්ඛාචරිය, රාජකීය පණ්ඩිත අතිපූජ්‍ය, කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ බුදු වසින් 2547 වැන්නෙහි ඇසළ මස පුර පසළොස්වක් පෝ දින හෙවත් ව්‍යවහාර වර්ෂ 2003 ජූලි මස 13 වන ඉරු දින රාත්‍රී 10.30 ට පමණ මනා සිහි නුවණින් යුතුව අපවත් වී වදාළ හ. එම ශ්‍රී දේහය පිළිබඳ ආදාහන පූජෝත්සවය ජූලි මස 20 වන ඉරිදා අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ දී සිදු කෙරෙයි. ඒ නිමිත්තෙන් ඒ මහා පුරුෂෝත්තමයාණන් වහන්සේගේ දිවි පවත ඉතා කෙටියෙන් සටහන් කිරීමට ය මේ මුල පුරනුයේ.

## උපත

සූර, වීර, උදාර දූ පුතුන් රැසක් ලක් මවුනට දායාද කළ රුහුණු රට මාතර දිස්ත්‍රික්කයෙහි කඩවැද්දුව ගමෙහි ව්‍ය. ව. 1907 අප්‍රේල් මස 01 වෙනිදා උදේ 7.30ට අප කථා නායකයාණෝ මෙලොව උපත ලද හ. පී. දොන් පුංචි අප්පුහාමි සහ වික්‍රමරත්න දිසානායක හාමිනේ (කපුදුව හාමිනේ) යන පින්වත් දෙමාපියන්ගේ සතරවන බාල ම දරුවාණන් ලෙසින් ජනිත වූ මේ කුල කුමරුවනට දොන් දිනේෂ් යන නම තබන ලදී.

## මූලික අධ්‍යාපනය

පස් හැවිරිදි වියේදී යටියන ස්වභාෂා පාඨශාලාවට ඇතුළත් කරනු ලැබූ දිනේෂ් කුමරු දීප්තිමත් අනාගතයකට පෙර නිමිති පහළ කරවමින් පස් වසරක් ඉතා දක්ෂ ලෙස එහි මූලික අධ්‍යාපනය ලැබී ය.

## පාසලින් පන්සලට

මේ අතර පුංචි අප්පුහාමි පිය තුමාණන්ගේ වැඩිමහලු සොයුරාණන් වූ එවකට යටවර ශ්‍රී වර්ධනාරාමාධිපති ව වැඩ විසූ ගරුතර කඩවැද්දුවේ සිරි සුගුණතිස්ස මහා ස්ථවිරයාණන් වහන්සේගේ උපස්ථානය පිණිස දස හැවිරිදි දිනේශ් කුමරුවාණන් යොමු කෙරුණේ උන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය ගරු පණ්ඩිතාචාර්‍ය කැකණදුරේ සිරි ආරියවිලාසාභ ස්ථවිරයාණන් වහන්සේගේ මැදිහත් වීමෙනි. සුගුණතිස්ස මාහිමියන්ගේ නියමයෙන් ගරු කොත්මලේ සිරි සද්ධම්මවංස හිමිපාණන් වෙතින් දිනේශයෝ පාලි හා සංස්කෘත ඉගෙනීම ආරම්භ කළ හ.

ඒ අතර ටික කලක් මාතර සිරිමංගල පිරිවෙනෙහි නැවතී සුපතළ මහා පඬි රුවනක් වූ ගරුතර පණ්ඩිත මාතර ශ්‍රී ධර්මවංශ මාහිමිපාණන් වහන්සේගේ සෙවනෙහි සිප් සතර හැදෑරීම වාසනාව ද දිනේශහට හිමි විය.

## ප්‍රව්‍රජ්‍යා ලාභය

ගරු සුගුණතිස්ස මාහිමිපාණන් විසින් ගරු අරියවිලාස හිමිපාණන්ට දිනේෂ් පැවිදි කරනු පිණිස භාර දෙන ලදුව, ඇවැසි මූලික බණ දහම් පුහුණු කොට ගත් තුදුස් වියැති දිනේශයෝ ව්‍ය. ව. 1921 අගෝස්තු 21 වන දා උදේ සුභ මොහොතෙන් ගරු අරියවිලාස හිමිපාණන් වැඩ සිටි හොරණ පූර්වාරාමයේදී ගරුතර සුගුණතිස්ස මාහිමිපාණන්ගේ උපාධ්‍යායත්වයෙන් හා ගරු අරියවිලාස තෙරපාණන්ගේ ආචාර්‍යත්වයෙන් එවකට රාමඤ්ඤ නිකායේ අධිකරණ නායක ධුරය ඉසුලූ අතිගරු කෝදාගොඩ උපසේන මාහිමිපාණන් වහන්සේගේ පින්බර අතින් "කඩවැද්දුවේ ජිනවංශ" නමින් පැවිදි බිමට බැස ගත් හ.

## පිරිවෙන් ඉගෙනුම

ගරු අරියවිලාස තෙරපාණෝ ජිනවංස තෙරණුපාණෝ වැඩිදුර අධ්‍යාපනය සඳහා පසු කලක රාමඤ්ඤ නිකායේ අනුනායක පදවිය දැරූ ගරුතර රස්නකවැවේ සිරි සද්ධම්මවංස මාහිමිපාණන්ට භාර දුන් හ. ඒ අනුව අප කථානායකයාණෝ පළමු ව පයාගල ධර්මගුප්ත පිරිවෙනෙහි ද දෙවනුව රස්නකවැවේ මාහිමිපාණන් විසින් ම ආරම්භ කරන ලද වැල්ලවත්තේ ධර්මෝදය පිරිවෙනෙහි ද ධර්ම ශාස්ත්‍ර අධ්‍යාපනය ලද හ. උන් වහන්සේගේ දක්ෂභාවය මොනොවට වටහාගත් රස්නකවැවේ මාහිමිපාණෝ ජිනවංස තෙරණුපාණන් ශිෂ්‍ය ගුරුවරයකු ලෙස පත් කළ හ.

## උපසම්පදා ප්‍රතිලාභය

සාමණේර අවදියෙහි ම දක්ෂ ධර්ම දේශකයකු ලෙස කීර්තියක් දිනාගත් ජිනවංස තෙරණුපාණන්ට විසි වස් පිරුණෙන්, බුදු වසින් 2471 ඇසළ මස පුර විසේනිය ලත් කිවි දින හෙවත් ව්‍ය. ව. 1927 ජූලි මස 03 වන දින පස්වරු 3.05 ට මිරිස්සේ පොල්වතුමෝදර උදකුක්ඛෙප සීමාවේදී එවකට රාමඤ්ඤ මහා නිකායෙහි මහානායක ධූරය දැරූ අතිගරු සිරි සද්ධම්මාචාර්‍ය මාතර ශ්‍රී ඤාණින්දාසභ මාහිමිපාණන්ගේ උපාධ්‍යායත්වයෙන් එතුමාණෝ අධිශිල සංඛ්‍යාත උපසම්පදා ප්‍රතිලාභය ලද හ.

## නව ආශ්‍රමයක් ඇති කරලීම

ව්‍ය. ව. 1929 දී ගරුතර රස්නකවැවේ මාහිමිපාණන්ට ලැබුණු වස් ආරාධනාවක් අප කථානායක හිමිපාණන්ට පවරන ලදුව, නෝර්ටන් බ්‍රිජ්හි අභිනව නිවෙසක වස් වැසූ උන් වහන්සේ එවකට ඒ පළාතේ බෞද්ධ ආශ්‍රමයක් නොමැති කමේ පාඩුව දැක, උග්‍ර කතෝලික ධනවතකු සතු ඉඩමකින් අක්කර දෙකක් ලබාගෙන එහි බෞද්ධ විහාරස්ථානයක් ගොඩ නැංවූයේ ස්වකීය අධිෂ්ඨානය හා සංවිධාන ශක්තිය විදහා දක්වමිනි.

## ග්‍රන්ථාකර පිරිවෙන

ගරු අරියවිලාස මාහිමිපාණන්ගේ ධර්මාචාර්‍ය වූ ගරුතර කිතලගම සීලවිමල මාහිමිපාණන්ගේ අපවත්වීමෙන් අනතුරු ව උන් වහන්සේ වැඩ සිටි තෙබුවන ගංගාරාමයට අරියවිලාස මාහිමිපාණන්ගේ නියමයෙන් වැඩම කළ අප ජිනවංස හිමිපාණෝ ව්‍ය. ව. 1932 දී ග්‍රන්ථාකර නමින් පිරිවෙනක් එහි ඇරඹුවේ ශිෂ්‍යයන් පස් දෙනෙකුගෙනි. දැඩි කැපවීමකින් යුක්ත ව එම පිරිවෙන දියුණු කර ගනිමින් පුරා වසර අටක් ම රජයේ හෝ වෙනත් ප්‍රබල ආයතනයක අනුග්‍රහයකින් තොර ව උන් වහන්සේ එය පවත්වාගෙන ගිය හ. පසු ව ප්‍රදේශයේ මන්ත්‍රීවරයා වූ සී. ඩබ්. ඩබ්. කන්නන්ගර ඇමතිතුමාගේ යෝජනාවකින් එය රජයේ ලියාපදිංචි කළ ද ඒ සඳහා රජයෙන් ලැබුණු ආධාර ගැන කිසිදු විමසීමක් නො කළ හ.

## රාජකීය පණ්ඩිත උපාධි ලාභය

ලාබාල වියෙහි සිට ම ඉගෙනුමට දස්කම් පෑ අප හිමිපාණෝ ව්‍ය. ව. 1931 දී ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයෙන් ද ව්‍ය. ව. 1940දී ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් ද ව්‍ය. ව. 1945 දී ප්‍රාචීන අවසාන විභාගයෙන් ද ඉහළින් ම සමත් ව රාජකීය පණ්ඩිත උපාධිලාභයෙන් සම්මානිත ව, ව්‍ය. ව. 1946 දී එම විභාගය මෙහෙයවූ ප්‍රාචීන භාෂෝපකාර සමිතියේ ගරු සාමාජිකත්වය ද ලැබූ හ. ඒ අතර ව්‍ය. ව. 1934 දී පිරිවෙන් අවසාන පරීක්ෂණයෙන් ද ඉහළින් ම සමත් වූ හ.

## නව මඟකට යොමු වීම

ග්‍රන්ථාකර පිරිවෙනෙහි දියුණුවට මහත් සේ වෙහෙස වන අතර ම විචිත්‍ර ධර්ම කථිකයකු ලෙස දිනූ කීර්තිය ඔස්සේ දිවයිනේ නන් දෙසින් ගලා ආ දම් දෙසුම් ඇරයුම් ද ඉටු කරමින් කාර්‍ය බහුල ජීවිතයක් ගත කළ අප මාහිමිපාණන්ගේ අනාගත ගමන් මඟ හෙළි පෙහෙළි කළ එක් සුවිශේෂී සිද්ධියක් ව්‍ය. ව. 1948 වෙසක් පුර පසළොස්වක පෝ දින සිදු විය. මෙදින එක් විහාරස්ථානයක ධර්ම දේශනාවකට වැඩම කළ උන්වහන්සේ බණ මඩුවෙහි රැඳී සිටියේ අබල දුබල වූ කීප දෙනෙකුන් පමණක් බව දුටුවා හ. කරුණු විමසූ විට දැනගත හැකි වූයේ අන් සියලු දෙන ම වෙසක් සැරසිලි නැරඹීමට නගරයට ගොස් සිටි බවකි. ලාංකික බෞද්ධයන්ගේ ආධ්‍යාත්මික ශූන්‍යතාව පිළිබඳ ව මහත් සේ සංවේගයට පත් වූ අප මාහිමිපාණෝ "නැග්ගට සුදුසු වෙසක් සැරසිල්ලක්" මැයෙන් සිත් කාවදින නිබන්ධනයක් සකසා "සිළුමිණ" පත්‍රයට යැවූ හ. එවකට "සිළුමිණ" පතෙහි ප්‍රධාන කර්තෘත්වය දැරූ හික්කඩුවේ ලියනගේ මහතා මේ ලිපිය පිළිබඳ අතිශයින් පැහැදී ව්‍ය. ව. 1949 මැයි මස 01 වන ඉරිදා යෙදුණු ඊළඟ වෙසක් පසළොස්වක දින "සිළුමිණ" පතෙහි මුල් පිටුවෙහි ම එය පළ කොට නව නවත් එබඳු ලිපි සපයන මෙන් අප මාහිමිපාණන්ට ඇරයුම් කළේ ය. ඒ අනුව තත්කාලීන ශාසනික පරිහානිය හා නිවැරදි ශාසන පරමාර්ථයන් අලළා සැකසුණු සැදැහැති බොදු සිත් අවදි කරවන කාලෝචිත ලිපි පෙළක් ම "සිළුමිණ" හා "දිනමිණ" පත්‍රවල පළ කෙරුණි.

මේ අතර එකල ගුවන් විදුලි සේවයෙහි අධ්‍යක්ෂකවරයා ද අප මාහිමිපාණන්ගේ දේශනා විලාශය පිළිබඳ ව පැහැදී දිගින් දිගට ම උන් වහන්සේට ගුවන් විදුලි ධර්ම දේශනා හා උදෑසන "මෛත්‍රී චින්තා" සඳහා අවස්ථාව සලසා දුන්නේ ය. එක් පොසොන් පුර පෝ දිනෙක අප මාහිමිපාණන් අනුරාධපුරයේ රුවන්වැලි සෑ මළුවෙහි සිට සජීවී ව පවත්වන ලද ගුවන් විදුලි දම් දෙසුම රටේ මහත් ආන්දෝලනයකට තුඩු දුන්නේ ය.

මෙම සමයෙහි අප මාහිමිපාණන් වහන්සේගේ චින්තනයෙහි මෙන් ම ක්‍රියාකාරිත්වයෙහි ද ප්‍රබල වෙනසක් සිදු වෙමින් පැවතිණ. ධර්ම දේශනා හා පුවත්පත් ලිපි මගින් උන් වහන්සේ නිබඳව ම අවධාරණය කළේ ශාසනික ප්‍රතිසංශෝධනයක් සිදු කිරීමට කාලය පැමිණ ඇති බව ය. විචිත්‍ර පින්කම් උත්සව, ගොඩනැගිලි ඉදි කිරීම වැනි බාහිර ක්‍රියාකාරකම් පිළිබඳ ව උන් වහන්සේගේ උනන්දුව කෙමෙන් හීන විය.

මේ අතර 2500 බුද්ධ ජයන්තිය ළඟා වන්නට වූයේ රට තුළ ඉමහත් බෞද්ධ ප්‍රබෝධයක් ඇති කර ලමිනි. දූරදර්ශී ඥානයෙන් හෙබි අප මාහිමිපාණෝ බුද්ධ ශාසනයේ චිරස්ථිතිය ද සලසමින් බුද්ධ ජයන්තිය සැමරීමේ උසස් ම ආකාරය නම් සිල්වත් ගුණවත් සඟ පිරිසක් බිහි කිරීම සඳහා අත්තිවාරමක් දැමීම බව පසක් කොට ගත් හ. උන් වහන්සේගේ දේශන - ලේඛන සියල්ල මේ අරමුණ වෙත ඒකරාශී වන්නට විය.

අප මාහිමිපාණන් වහන්සේ ලියුම් කියුම් තුළින් ප්‍රබුද්ධ වූ ගිහි - පැවිදි සත්පුරුෂයෝ රැසක් උන් වහන්සේ වටා රොක් වන්නට වූ හ. ඒ අතුරින් එක් සූධීවරයකු වූ බෝමිරියේ ඩී. ඊ. සෙනෙවිරත්න මහතා උන් වහන්සේ තම නිවෙසට වඩමවාගෙන දීර්ඝ වශයෙන් සාකච්ඡා කොට, පිළිවෙත් සරු සඟ පිරිසක් බිහි කරලීමේ වැඩ පිළිවෙළක් දියත් කරන මෙන් අප මාහිමිපාණන් වහන්සේට ගෞරවයෙන් ආරාධනා කොට, ඒ සඳහා අවශ්‍ය පරිදි ආශ්‍රමයක් තම වියදමින් ඉදි කර දෙන බවට ප්‍රතිඥාවක් ද දුන්නේ ය. එහෙත් එතුමාගේ අකල් මරණය හේතුවෙන් ඒ අනුග්‍රහය නො ලැබී ගිය ද, යෝගාශ්‍රම සංස්ථාවේ ආරම්භය පිළිබඳ පවිත්‍ර සංකල්පය එදා මුල් බැස ගත්තේ ය.

## කලණ මිතුරු එකතුවක්

යෝගාශ්‍රම වැඩ පිළිවෙළක් ඇරඹීමේ ශුද්ධ ප්‍රාර්ථනය මුදුන්පත් කර ගැනීමට දැඩි කැපවීමකින් එකලා ව ක්‍රියාත්මක වූ අප මාහිමිපාණන් වහන්සේ මෙම ශාසනික ව්‍යාපාරයේ මුලසුන ඉසිලීමට සුදුසු වැඩිහිටි මහ තෙර නමක් සොයා ගැනීමට උත්සුක වූ හ. මේ සුවිසල් වගකීම දැරීමට එක ම සුදුස්සා නම්, එවකට දේවගොඩ විජයාරාමාධිපති ව විවේකී ව වැඩ සිටි, ත්‍රිපිටක ධර්ම හා භාෂා ශාස්ත්‍ර පිළිබඳ හසළ දැනුමකින් පිරිපුන් ව, යටපත් ව ගිය පෞරාණික භාවනා ක්‍රම නැවත මතු කර ගැනීමට බලවත් උනන්දුවෙන් ක්‍රියාත්මක වූ, අතිපූජ්‍ය මාතර ශ්‍රී ඥානාරාම ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ බව අප මාහිමිපාණන් වහන්සේ තීරණය කළ හ. මුලදී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ භාරදූර කාර්යය භාර ගැනීමට මැලි වූයේ, උන් වහන්සේ විවේකීව ම විසීමට බෙහෙවින් ප්‍රිය කළ නිසා ය. එහෙත් පසු ව අප මාහිමිපාණන් වහන්සේගේ හද පණ ගන්වන අව්‍යාජ කරුණු දැක්වීම තුළින් ඔදවත් වී, "මේ ශාසනික කටයුත්ත වෙනුවෙන් ඕනෑ ම ගහක් - ගලක් යට මගේ ජීවිතය කැප කිරීමට මම සූදානම්" යයි අභීත ව පවසමින් ජීවිත පරිත්‍යාග කරමින් අප මාහිමිපාණන් වහන්සේ හා එක් වූ මේ මහා සත්පුරුෂයාණන් ව්‍ය. ව. 1992 අප්‍රේල් මස 30 දා අවසන් සුසුම හෙළන තෙක් ම ඒ ප්‍රතිඥාව එලෙසින් ම ඉටු කරමින් අප මාහිමිපාණන් වහන්සේට ඉමහත් පිටුබලයක් වූයේ, පෙර සසරේදී ද මෙසේ එක්වම සසුන් ව යෙදී සිටි බවට තහවුරු කරන සේය ("අධික ග්‍රීෂ්මය පවතින විටෙකදී සිසිල් සෙවන දෙන මහා ගසක් මෙන් ඥානාරාම ස්වාමීන් වහන්සේ අපට සෙවන දුන් මහා සත්පුරුෂ උත්තමයෙකි" යි අප මාහිමිපාණන් වහන්සේ අපවත් වීමට දෙදිනකට පෙර පැවසූ හ).

ඒ අතර ම මැල්ලගල යෝගාරාමාධිපති ව වැඩ විසූ ප්‍රතිපත්තිගරුක මහ තෙර නමක් වූ අතිපූජ්‍ය අස්මඬලේ රතනපාල මාහිමිපාණන් වහන්සේ, තදීය ශිෂ්‍ය ගරු කෙහෙල්පන්නල සුමන ස්වාමීන් වහන්සේ, නාරම්මල රුවන්ගිරිකන්ද ආරණ්‍ය සේනාසනයෙහි දිගු කලක් තපෝගුණාධාරී ව වැඩ සිටි අතිපූජ්‍ය විදර්ශනාචාර්ය මාතලේ සීලරක්ඛිත මාහිමිපාණන් වහන්සේ වැනි තත්කාලීන සිල්වත් ගුණවත් මහ තෙරුන් වහන්සේලා ද අප මාහිමිපාණන් වහන්සේගේ උදාර වැඩ පිළිවෙළට එක් වූ හ.

## ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව ස්ථාපිත වීම

මෙම කල්‍යාණ මිත්‍ර සමාගමයෙන් වඩාත් ධෛර්යමත් වූ අප මාහිමිපාණන් වහන්සේ තමන් වහන්සේ ම ආරම්භ කොට එකුන් විසි වසක් තුළ දැඩි පරිශ්‍රමයෙන් වැඩි දියුණු කළ ග්‍රන්ථාකර පිරිවෙනත් එහි ගෝල බාලයන් හා දායක පිරිසත් හැරපියා තදීය කිංකර ශිෂ්‍ය, පසු කලක ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ අතිරේක විංශත් වාර්ගික කාරක සංඝ සභාවේ ප්‍රථම සභාපති ධුරයට පත් වූ ගරුතර ගැටමාන්නේ විමලවංස තෙරුන් වහන්සේ ද සමඟ, තුන් සිවුර, පාත්‍රය හා තල් අතු කුඩය පමණක් ගෙන ආරණ්‍යවාසී ජීවිතයකට මුල පුරමින් දෙවන අභිනිෂ්ක්‍රමණයක යෙදුණේ සම්බුදු සසුන සුරකින පිළිවෙත් සරු යෝගාවචර සඟ පිරිසක් බිහි කරලීමේ මහාර්ඝ චේතනාවෙනි.

ව්‍ය. ව. 1951 මාර්තු මස 25 දා වැල්ලවත්තේ ධර්මෝදය පිරිවෙනෙහි පැවැත්වුණු සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගත් යෝගාංකුරයන් 12 දෙනෙකුන් ඒ ඒ තැන්වලදී සුදුසු පුහුණුවක් ලබාදීමෙන් අනතුරු ව එම වස ජූනි මස 18 වෙනිදාට යෙදුණු පොසොන් පුර පසළොස්වක් පෝ දින අම්බලන්ගොඩ දෙල්දූව ආරණ්‍ය සේනාසනයේදී අතිගරු රස්නකවැවේ ශ්‍රී සද්ධම්මවංශ අනුනායක මාහිමිපාණන් වහන්සේ වෙතින් උතුම් සසුන් පැවිද්ද ලබා ගැනීමෙන් ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව ආරම්භ කෙරුණි.

මෙතැන් සිට යෝගාශ්‍රම සංස්ථාවේ අභිවෘද්ධිය උදෙසා අප්‍රතිහත ධෛර්යයෙන් හා පූර්ණ කැපවීමෙන් ක්‍රියාත්මක වූ අප මාහිමිපාණන් වහන්සේ තමනට මුහුණ පෑමට වූ සියලු බාධක දුෂ්කරතා අභිභවනය කළේ සංග්‍රාමගත මහා හස්ති රාජයකු පරිද්දෙනි. අව්, වැසි, පිනි හා වෙහෙස නො තකා සැතපුම් සිය දහස් ගණන් වඩිමින්, ඇතැමුන්ගේ ඇණුම් බැණුම් අපහාස ඉවසමින් ස්ථානෝචිත ප්‍රඥාවෙන් සියලු ගැටලු-බාධක සමනය කරමින්, ස්වකීය ලේඛන හා දේශනා මගින් සියල්ලන්ගේ සිත් දිනා ගනිමින්, උන් වහන්සේ ගෙන ගිය ඒ යෝධ ව්‍යායාමය කෙමෙන් මල් - පල දරන්නට විය. දිවයිනේ නන් දෙස අරණ්‍ය සේනාසන, විවේක සේනාසන බිහි වෙමින්, සිය ගණන් සැදැහැවත් කුල දරුවන් පැවිදි වෙමින්, දහස් ගණන්, දායක කාරකාදීන් එක් රොක් වෙමින්, අතු පතර විහිදුණු ශක්තිමත් මහා රුකක් සේ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව ස්ථාපිත විය. ස්වකීය උපසම්පදා හා පරිපාලන කටයුතු ස්වාධීන ව කරගෙන යාමට මහා නිකායෙන් අවසර ලැබුණි. පරිපාලන කටයුතු පහසු කරලීම සඳහා අතිරේක විංශත් වාර්ගික කාරක සංඝ සභාවක් ද පත් කෙරුණි. නිස්සරණාධ්‍යාශය මතු කරලන කතිකාවතක් හා දින චරියාවක් ද සම්මත කෙරුණි. ධර්ම විනය අධ්‍යාපනය හා භාවනා පුහුණුව සඳහා ඒ ඒ සෙනසුන් සම්මත කොට ගන්නා ලදී. වාර්ෂික ත්‍රිපිටක ධර්ම පරීක්ෂණයක් පවත්වා ඉන් සමත් වූවනට සහතික හා ත්‍යාග ප්‍රදානය කෙරිණි.

වර්තමානයෙහි සේනාසන 125 ක පමණ වැඩ වසන දහසක් පමණ සඟ පිරිසකින් සමන්විත වන යෝගාශ්‍රම සංස්ථාව, මින් දෙවසරකට පෙර පනස් වසරක ස්වර්ණ ජයන්තිය සමරන අවස්ථාව සියැසින් දුටු අප මාහිමිපාණන් වහන්සේ සම්බුදු සසුන සුරැකීමට තමන් වහන්සේ ගත් මහා උත්සාහය ඒකාන්තයෙන් ම සඵලවත් වී ඇතැයි අමන්දානන්දයට පත් වන්නට ඇති බවට කිසිදු සැකයක් නැත.

## බුද්ධ භූමි වන්දනාව

අතිගරු මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ යෝගාශ්‍රමීය සඟ පිරිසක් සමඟ ව්‍ය. ව. 1960 දී අප මාහිමිපාණන් වහන්සේ යෙදුණු දඹදිව ශුද්ධ භූමි වන්දනාව ද මෙහිදී සනිටුහන් කිරීම සුදුසු වනු ඇත.

## සම්මාන ප්‍රදාන

අප මාහිමිපාණන් වහන්සේ ගරු නම්බු සම්මාන පිළිබඳ අපේක්ෂාවන් එක හෙළා බැහැර කළ ද, උන් වහන්සේගේ උදාර ශාසන මෙහෙවර අගය කිරීම් වස් ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායෙන් 'ශ්‍රී ආර්යවිලාස වංශාලංකාර සද්ධර්මවාගීශ්වරාචාර්ය' යන ගෞරව නාමය සහිත ව අතිගරු මහෝපාධ්‍යාය පදවියෙන් ද, සමස්ත ලංකා අමරපුර මහා සංඝ සභාවෙන් "පටිපත්ති සෝභන ගණපාමොක්ඛාචරිය" යන ගෞරව නාමයෙන් ද පුදන ලද හ. එහෙත් රාමඤ්ඤ නිකායේ උසස්තම පදවියක් හිස් වූ විටෙක ඒ සඳහා ඉදිරිපත් වන්නැ යි කරන ලද ආයාචනයන් උන් වහන්සේ සුහද ව ප්‍රතික්ෂේප කළ හ.

## නිත්‍ය වාසය

යෝගාශ්‍රම සංස්ථාව ආරම්භයේදී විවිධ අරණ්‍ය සේනාසනවල වරින් වර වැඩ සිටි අප මාහිමිපාණන් වහන්සේ පසු කලෙක අම්බලන්ගොඩ ගල්දූවේ ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානය ස්වකීය නිත්‍ය වාසය සඳහා තෝරා ගත් හ. එනිසා ම මෙම සෙනසුන යෝගාශ්‍රම සංස්ථාවේ මූලස්ථානය ලෙසින් ද සම්මත විය.

කලක් යෝගාශ්‍රමීය සේනාසන මුළුල්ලෙහි ම වඩිමින් ඒ ඒ තැන්වල වැඩි දියුණුවට කටයුතු කරමින් මහත් සේ වෙහෙසුණු අප මාහිමිපාණන් වහන්සේ තම වීරෝදාර ශාසනික ව්‍යායාමයේ මිහිරි ඵල සැනසිලි සුවයෙන් විඳිමින් ගල්දූව මධ්‍යස්ථානයෙහි ම විවේකී සුවයෙන් වැඩ සිටිය හ.

## අවසන් සමය

ජීවිතයේ අවසාන භාගයේදී මහළු විය හේතුවෙන් ශරීරය දුර්වල වුව ද මාහිමිපාණන් වහන්සේගේ සිත වඩවඩාත් ශක්තිමත් වූ බවක් දක්නට ලැබුණි. ස්වකීය අභිජාත ශිෂ්‍ය රත්නය වන අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේ, ගරුතර කහගොල්ලේ සෝමවංස ස්ථවිරයාණන් වහන්සේ ප්‍රධාන බොහෝ පැවිදි සිසුන්ගේ ද විශේෂඥ වෛද්‍ය කීර්ති ගුණසේකර මහතා ප්‍රමුඛ භක්තිමත් වෛද්‍යවරුනගේ ද නම් වශයෙන් මෙහි සඳහන් නො කළ හැකි තරම් බොහෝ වූ සැදැහැති උපාසක - උපාසිකාවන්ගේ ද අනේකාකාර උපස්ථානයන් නො මඳව ලබා ගැනුමට තරම් අප මාහිමිපාණන් වහන්සේ භාග්‍ය සම්පන්න වූ හ. විවිධ ආබාධ නිසා කීප වරක් ම උන් වහන්සේ රෝහල්ගත කෙරුණු අතර ඒ හැම විටකදී ම ඒ හැම තැනකදී ම උන් වහන්සේට ඉහළ ම මට්ටමේ උපස්ථාන සැලසුණේ මාහිමිපාණන් වහන්සේගේ පුණ්‍ය භාග්‍යය නිසාම ය.

අපවත් වීමට දෙදිනකට පෙර එනම් ජූලි මස 11 වන දින සන්ධ්‍යාවේදී තමනට උපස්ථාන කළ සිසු දරු පිරිස අමතා පැය 2 1/2 ක් පමණ එක දිගට කථා කරමින් මාහිමිපාණන් වහන්සේ ආශ්චර්යමත් ප්‍රාතිහාර්යයක යෙදුණා හ. දින දෙකකට වඩා තමන් වහන්සේට ජීවත් නො වන බවත්, දැන් මෙතන දෙවියන් එක් රොක් ව සිටින බවත්, තමන් වහන්සේ ගැන කම්පා නො විය යුතු බවත්, ආත්ම ප්‍රත්‍යවේක්ෂණය තුළින් තමන් වහන්සේගේ සිත ශක්තිමත් කරගෙන සිටින බවත්, තමන් වහන්සේට කිසි ම බැඳීමක් - විශේෂ ඕනෑකමක් නැති බවත්, තමන් වහන්සේ මේ සිසු දරුවනට පියකු වූ බවත්, මේ දරු පිරිස සමඟ එකට නිවන දක්වා යාම තමන් වහන්සේගේ එක ම පැතුම බවත්, වදාළ මාහිමිපාණන් වහන්සේ තමන් වහන්සේ සතු සියලු දේ සඟ සතු කොට, තමන් වහන්සේට උපස්ථාන කළ හැමට පින් දුන් හ. තමන් වහන්සේගේ ජීවන තොරතුරු රැසක් ද හෙළි කළ මාහිමිපාණන් වහන්සේ මේ තමන් වහන්සේගේ අවසාන අවවාදය බවත්, එය හොඳින් අසා පිළිපදින ලෙසත් දන්වා, "මේ ශාසන ප්‍රතිපදාව සමගි සම්පන්න ව දිගට ම කරගෙන යන්නැ" යි වදාළ හ.

ජූලි මස 13 දා අපවත් වීමට ටික වේලාවකට පෙර එදින පෝය හා පක්ෂය විමසා, පසළොස්වක පෝ දින නිසා ආපත්ති දේශනා කොටගෙන, සංඝයාගේ පාමොක් උදෙසීම සඳහා ස්වකීය ඡන්ද පාරිශුද්ධිය ද දුන්නේ මහා සිහි නුවණින් යුතුව ය.


ඒ ඇසළ පුර පසළොස්වක දින රාත්‍රියේදී බුද්ධ ශාසනය බබුළුවා ලූ මහා පහනක් නිවී ගියේ ය. වර්තමානයෙහි සුපේශල ශික්ෂාකාමී මහ සඟ රුවන නමැති මල් ගොන්නෙහි එක් සුවඳවත් මලක් මිලාන විය. සිය ගණන් සැදැහැති කුල දරුවනට උත්තම ශාසනික ප්‍රව්‍රජ්‍යාව දායාද කළ පින්බර දෝතක් සදහට ම අකර්මණ්‍ය විය. සුවහසක් හදවත් පුබුදු කළ හඬක් නිහඬ විය. සුවහසක් සිත් ඔදවත් කළ අසිරිමත් ලේඛන ශෛලියකට නැවතීමේ තිත වැටුණි. දහස් ගණන් ගිහි - පැවිදි සිසුනට දයාබර සත්පුරුෂ පියතුමෙක් අහිමි විය.

එසේ වතුදු අතිගරු මාහිමිපාණන් වහන්සේගේ නිර්මල - අව්‍යාජ - චාම් ආදර්ශ සම්පන්න දිවි පෙවෙත මෙනෙහි කොට අපට සතුටු විය හැකි ය. එහෙයින් මාහිමිපාණන් වහන්සේ දිවමන් කල නිතොර වදාළ පරිද්දෙන් "දෙයක් නැහැ" යි අපිදු සිත් සනසා ගනිමු.


අපවත් වී වදාළ බෝධිසත්ව ගුණෝපේත, මහා කල්‍යාණ මිත්‍ර අති ගරු පූජනීය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන මහෝපාධ්‍යාය ස්වාමීන්ද්‍රෝත්තමයාණන් වහන්සේගේ ශ්‍රී දේහය පාමුල පසඟ පිහිටුවා වැඳ නමස්කාර කොට අපි මෙසේ පතමු.

"මහා ස්වාමීන්ද්‍රෝත්තමයාණන් වහන්ස, නැවත නැවත අප අතර ඉපිද අප හැමට මහා කල්‍යාණ මිත්‍රයෙක් වන සේක්වා! සුව සේ බුද්ධ කාරක ධර්ම සපුරාගෙන, අසංඛෙය්‍ය සංඛ්‍යාත ලෝක සත්ත්වයනට අමා මහා නිවන් දොරටු විවර කිරීමට පරමෝත්තම සම්මා සම්බුද්ධත්වය ම අධිගමනය කරත්වා!"






අතිගරු පූජනීය, රාජකීය පණ්ඩිත
කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන
මහෝපාධ්‍යාය මා හිමියන්








ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ දසවන මහානායක ධූරය දැරූ අතිගරු පූජනීය විද්‍යා විශාරද රාජකීය පණ්ඩිත ඉදුරුවේ උත්තරානන්දාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේ හා අතිගරු පූජනීය කෝට්ටේ දේවානන්ද හිමිපාණන් සමඟ වැඩසිටින අයුරු ඉහළ ඡායා රූපයෙන් දැක්වෙන අතර දකුණු පසින් දැක්වෙන්නේ නිමලව අරණ්‍ය සේනාසනයේදී සිදු වූ ගරු උපසම්පදා විනය කර්මයක් සඳහා අතිගරු පූජනීය මාතර ශ්‍රී ඤාණාරාම මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ සමග වැඩසිටින ඡායා රූපයකි.









මේ සටන් අදහසක් ඉදිරිපත් කෙළේ අපත් මේ පවත්වාගෙන යන්නේ සටනක් බව හැඟවීමටයි. අපේ සටන බුදු සසුන බේරා ගැනීම සඳහාය. මේ නමලා සසුන බේරා ගැනීමේ උතුම් සටනේ යෝධ පෙළට ඇතුළත් වී සිටින වග සිහිකළ යුත්තේ ධර්ම සන්තෝසයෙනි. අපේ මේ සටනෙහි පැරදීමක් නැත. මොහොතක් පාසා සසුන් ගුණ රකිමින් අප ඉදිරියට යන්නේ දිනීමේ සතුට වඩමිනි. කොහාට ගියත් මේ සිහි ඇතිව අකම්පාව ක්‍රියා කළ යුතු බව ඉතා කරුණාවෙන් සඳහන් කරමි.

බුදුරජාණන් වහන්සේ අපට දී වදළේ නොනිවෙන ආලෝකයකි. ධර්මය ඉගෙන ගතයුත්තේ උගත්කමක් ඇති කර ගැනීමට, අනුන්ට කියා දීමට පමණක් නොවෙයි. මූලික වශයෙන් ධර්මය පිහිට කරගත යුත්තේ අපේම සැනසිල්ල පිණිසය. අපේම ශික්ෂණ හැදිල්ල පිණිසය. කොයි තරම් බණ ඉගෙන ගත්තත්, කොයිතරම් අනුන්ට බණ කිව්වත් ධර්මානුරූපිව ආත්ම සංයමයක් තමන්ගේ හැදිල්ලක් නොවුව හොත් එය අන්ධයෙකු අතටගත් පහනක ස්වරූපයට පත්වන්නේය. අප විසින් ශාසන රැකගන්නාය, අපෙන් ශාසනයට වැඩක් සිදුවෙනවාය කියා සැළකිය හැක්කේ ශාසන ගුණයෙන් අපි ඒළිය වූ කල්හිය.

"එසමග්ගො මහන්තෙහි අනුයාතො මහෙසිහි" මේ ලොවුතුරා සැනිසලි මාර්ගය බුද්ධාදී ආර්ය උතුමන් අනුයාත වූවකි. එහි අදහස දුක් කෙළවර කිරීමේ ශාන්ති මාර්ගය එකක්ම බවයි. අනන්ත අපරිමාණ බුදුවරයෝ පසේ බුදුවරයෝ මහරහත් හු මේ පිළිවෙන් මගින්ම නිවනට පිවිසියහ. අපරිමාණ ආර්ය උතුමන්ගෙන් ඒළිය වූ පිවිතුරු නිවන් මගටයි අපත් මේ බැසගෙන සිටින්නේ. අපෙන් මේ මඟ නොකෙලෙසේවා අපෙනුත් ඒ අනුත්තර මාර්ගයට යමිනමින් හෝ ඒළියක් වැටේවා යන ප්‍රණීත සංකල්පයෙනි අපේ ඉදිරි ගමන විය යුත්තේ.
















අපි දවසින් දවස වැඩිහිටියන් වෙමු.


මා මෙයින් අදහස් කරන්නේ කවුරුත් අදහස් කරන වයසින් වැඩිහිටිකම නොවේ. දීර්ඝ සංසාරයේ ජීවිත ලබා නොයෙක් දේවලුත් සමඟ වැඩිහිටියන් වූ සැටි අපට සිතා ගත හැකිය. ඒ සාමාන්‍ය වැඩිහිටිකමෙන් ජීවිත අගයේ වැඩීමක් නැත.


අද අපේ ජීවිත වාසනාව පුදුම සහිතය.
ගෙවෙන මොහොතක් පාසා අප විශේෂභාගීය තත්ත්වයට පත්කෙරෙන ජීවිත අගය වැඩිකරන වැඩිහිටිකම වාසනාව අද අපට ලැබී තිබෙනවා.
ආධ්‍යාත්මික ඥාණ ගුණ වශයෙන් අපේ වැඩිහිටිකම ජීවිත අගය වඩන්නේ හුස්ම රැල්ලෙහි ද ඒ මහිමය පිළිබිඹුවන හෙයිනි. සැනසිලි ගමනෙහි පියවරක් පාසා පිවිතුරු කෙරෙමිනි.
ඊයේ බුදුරජාණන් වහන්සේ උදෙසා පූජාකළ මලට පහනට වඩා අද අප පූජා කරන මලේ පහනේ අගය වැඩිය. ඊයේට වඩා අද අප සිතින් වැඩිහිටියන්ව ඒ වැඩිහිටිකමේ විසිතුර මේ මලට පහනට එක්කර අද පූජාව පවත්වන හෙයිනි.

සද්ධා, සති, සමාධි, ඥාණ, කරුණා, මෛත්‍රී ගුණයෙන් දවසින් දවස අප වැඩිහිටියන් වන සැටින්, එයින් අපේ කායික, වාචසික, පැවතුම් වැඩි අගයට පවත්වන සැටින් සිහිකළ මැනවි










අපත් අපේ අතීතය දෙස බලා තමන් අත්කල සැනසිල්ලෙහි සතුටත් ඉදිරි ජීවිත ගමනෙහි ප්‍රබුද්ධ අධිෂ්ඨානයත් උනන්දුවත් ඇතිකර ගැනීම ධර්ම ප්‍රාර්ථනා සමෘද්ධියෙහි ආසන්න කාරණා වන්නේය.

මගේ දින චරියාවේ දින පොත ලිවීම දවසේ එක වෙලාවක සිදුකෙරෙන එක් වැඩෙකි. මම අළුත් දින පොතේ යමක් ලියන්ට සූදානම් වී පසුගිය අවුරුද්දේ ලියා අවසන් කල දින පොත පෙරලා බැලීමි. අවසන් පිටුවේ මෙසේ සඳහන්ව තිබුණා. මේ දින පොතේ නොසිස් පිටු මෙන් 'මගේ ජීවිතයද නොසිස් වේවා' යනුයි. ඒ දින පොතේ එක් පිටුවක්වත් හිස් නොවීය. දිනපතා ජීවිත තොරතුරු එහි ලියා තිබුණි.

ගෙවෙන දවස් එසේ නොසිස්ව වැඩෙහි යෙදෙන්නට-අත්තහිත පරහිත සාධනයට හිත සකස් කර ගැනීම අතීතයෙන් වැඩ ගත යුතු හොඳම වැඩ පිළිවෙලයි.





















ජීවිතය ගලා යන ගඟක් වැනිය. ගඟ ගලායාම ස්වභාවික දෙයකි. එය නැවැත්විය හැක්කක් නොවේ. ගඟ ගැල්ම නැවැත්විය නොහැකි නමුත් ඒ ගලන වතුරෙන් වැඩ ගත හැකිය. නෑම කළ හැකිය. පරිභෝගයෙන් කිලිටි වන ඇඳුම් උපකරණ සෝද පවිත්‍ර කළ හැකිය. වතුර ගලනවාය කියා දුක් නොවී එයින් වැඩ ගැන්ම ඤාණ ගෝචරයි. ජීවිතය ගැනද සිතිය යුත්තේ මෙයාකාරයෙනි. මොහොතක් පාසා ගෙවී යන ජීවිතය මොන ලෙසකින්වත් අපට නවතා ගත නොහැකිය. ඒ ගැන දුක් නොවී අප විසින් කළ යුත්තේ ගෙවෙන ජීවිතයෙන් නොගෙවෙන ශක්තියක් හද ගැනීමයි. මහා කාරුණික බුදුපියාණන්වහන්සේ ලොවට පහද වදළ ප්‍රතිපත්ති මාර්ගය නම් මේ අනිත්‍ය අසාර ජීවිතයෙන් නිත්‍යසාර තත්වයක් ඉදිකර ගැනීමේ නොවරදින උතුම් වැඩ පිළිවෙලය. මෙය තේරුම් ගෙන ඒ අනුව ක්‍රියා කිරීමෙන් ජීවිතය ප්‍රාතිහාර්යයක් බවට පත් කළ හැකිය. මේ ජීවිත ප්‍රාතිහාර්ය හැමටම සිදුකළ නොහැකිය. එයට මහා වාසනාවක් තිබිය යුතුය.





වස් කාලය ගෙවී ගියේ අපට යමක් ඉතුරු කරමිනි. ඒ අප වඩා ගත් ධර්ම සම්පත්තියයි. අප මෙතෙක් ගෙවූ අපරිමාණ සංසාර ජීවිත ගැන සලකන විට සිතට පෙනී යන්නේ දුකෙන් දුකට මාරු වෙමින් දිගට ගෙන ගිය සංවේගනීය අවාසනාවන්ත ගමනෙකි. අතීත බුද්ධ ශාසනය කොතෙක්ද? ඒ සසුන් එළියෙන් නිවී සැනසී දුක් ඉවර කර ගත් අසංඛ්‍ය පිණැතියන් අතරට අප ඇතුළත් වී නැත. දැන් ඉතින් ඒ අතීත අපල ගැන දුක් නොවී අද කළ යුත්තේ මේ ලැබූ ජීවිත වාසනාව ජීවමාන බවට පත්කර ගැනීමයි. අප මේ දියුණු කරන්නේ නොමැරෙන ස්වරූපයේ ආධ්‍යාත්ම ජීවයෙකි.

අද අප ඇතිකර ගන්නා ධර්ම සැපය අජරය. අමරය. ඒ උතුම් ජීවිත සැනසුම අපේ අනුගාමික ජීවිත මහිමය වශයෙන් දැක්ක යුත්තේ පරලොව වශයෙන් පමණක් නොවේ. අපේ ගතවන හැම මිනිත්තුවක්ම ඊළඟ මිනිත්තුව ජනිතකර වන්නේ අනුගාමික ජීවිත මහිමය එක් කරමිනි. අපේ දවස් - මාස - අවුරුදු ගෙවෙන්නේත් එලෙසිනි.









මී වදයක පිරී තිබෙන්නේ මී පැණිය. ගුණයත්, මිහිරත් පිරීගත්
මී පැණි අපට සාදා දෙන මී මැස්සාගෙන් සිදුවන සේවය
මොන තරම් විසිතුරුද? කල්‍යාණ මිත්‍ර සම්පත්තියත් එබඳුයි.
මී පැණි හද ලොවට මිහිර දෙන මී මැසි පෙළක් වගේ
කරුණාවෙන්, මෛත්‍රියෙන් ලොව සනසන කල්‍යාණ මිත්‍ර පෙරහැර
මොනතරම් පිවිතුරුද? ඔබ වහන්සේලා මේ එකට වෙළීගෙන මේ
පවත්වන්නේ ඒ අසිරිමත් පෙරහැර නොවේද?

ගුණයෙන් නුවණින් විසිතුරු වූ පහන් වූ සිතුවිලි
අපට නිරතුරු පහළ වේවා!
මී පැණි මෙන් මිහිරි පිය වදන් නිරතුරු කියවේවා! ලියවේවා!
අප සැනසී ලොවට සැනසුම දීමේ වාසනාව නව නව දියුණු වේවා!
අපේ හුස්ම රැල්ලත් ලොවට සැප සැනසිලි පිණිස වේවා!





# යෝගාශ්‍රමාධිපති,
# මහා කම්මට්ඨානාචාර්ය,
# අතිපූජනීය නාඋයනේ
# අරියධම්මාභිධාන
# මහෝපාධ්‍යාය
# මා හිමිපාණන් වහන්සේගේ

## පණිවුඩය

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස!!!**

පියෝ ච ගරු භාවනීයො - වත්තා ච වචන
ගම්භීරඤ්ච කථා කතාකා - නො චට්ඨානෙ නයොජෙහී
(සං. නි.)

සීලා දී කලයාණ මිත්‍ර ගුණයෙන් ප්‍රිය මනාප වූ සීල සමාධි ප්‍රඥා අප්පිච්ඡතා සන්තුෂ්ඨිතා ප්‍රවිවේකිතා විරියරම්භකා අසංසර්ගතා දී නානා ගුණ විශේෂයන්ගෙන් සම්භාවනීය වූ, අර්ථයෙන් ධර්මයෙන් විනයෙන් අනුශාසනා කරන්නා වූ, කොතරම්වූද නින්ද අපහාස ගර්ජන තර්ජය නපුරු වචනපථ වුවත් මහා සිහි නුවණින් අධිවාසනය කරන්නා වූ, අර්ථයෙන් ධර්මයෙන් ගැඹුරු වූද සාරධර්මයෙන් හේතු කරුණු උදාහරණ සහිතව අනුකම්පා පෙරදැරිව කියා දෙන්නා වූ, තෘෂ්ණා දෘෂ්ටි මාන වැඩෙන සසර දුකට වැටෙන අනර්ථදායක කටයුතු වලින් වළක්වා සීල සමාධි ප්‍රඥා ධ්‍යාන අභිඥා විදර්ශනාඥාණ ධර්මඥාන භාවනා ඥාන වැඩෙන යහපත් පිළිවෙත්හි යොදන්නා වූ, කලයාණ මිත්‍රයන් වහන්සේ දැකීම-ඇසීම-සිහිකිරීම-ඇසුරුකිරීම-අනුගමනය කිරීම මෙලොවට පරලොවට නිවනට හිතසුව පිණිසම හේතුවන්නේ ඉර එළිය සඳඑළිය තුලින් ලැබෙන ප්‍රයෝජනය මෙනි.

තත්‍ථ කථමා කලයාණමිත්තතා - යෙ තෙ පුග්ගලා සද්ධාසම්පන්නා සීලසම්පන්නා සුතසම්පන්නා ත්‍යාගසම්පන්නා ප්‍රඥාසම්ප්හිතා යා තෙසං පුග්ගලානං ආසෙවනා නිසෙවනා සංසේවනා භාජනා සම්භජනා භත්ති අයං වුච්චති කලයාණමිත්තතා.

කලයාණ මිත්‍ර සම්පත්තිය නම් කවරේද? යම් උතුම් පුද්ගල කෙනෙක් අචල ශ්‍රද්ධාවන්ද සිවුපිරිසිදු ශීලසම්පන්නද ධර්ම විනය ආගම අධිගම පිළිබඳ බහුශ්‍රැත සම්පන්නද නොමසුරුව ත්‍යාග සම්පන්නද ගම්භීර ප්‍රඥාවෙන් සමන්නාගතද එවැනි උතුමන් ශ්‍රද්ධාව හේතුවෙන් මෛත්‍රී සහිත ආදරයෙන් ආශ්‍රය කිරීම, ගෞරවයෙන් ආශ්‍රය කිරීම, නිතර ආශ්‍රය කිරීම, භාජනය කිරීම, ගෞරවයෙන් භාජනය කිරීම, භක්තිමත් වීම, ගෞරව සම්ප්‍රයුක්තව භක්තිමත් වීම, එවැනි උතුමන්ට නැඹුරුව ආශ්‍රය කිරීම කලයාණ මිත්‍රත්වයයි. දශබලධාරී සර්වඥයන් වහන්සේපටන් අතීතයෙහි බුදුසසුන බුබුළුවමින් වැඩසිටි අගසව් මහසව් ආදී මහෝත්තමයන් වහන්සේලාගේ චරිතාපදාන සිහිපත් කිරීම, මෑත භාගයෙහි වැඩසිටියා වූ ශාසන භාරධාරී ආචාර්ය උපාධ්‍යායාදී කලයාණ මිත්‍රයන් වහන්සේලාගේ චරිතාපදාන සිහිපත් කිරීම සහ අනුගමනය කිරීම ස්වකීය ගුණ නුවණ දියුණුවට හේතුවන අනුස්සතානුත්තරියකි.


ධීරං පස්සෙ සුණෙ ධීරං - ධීරෙන සහ සංවසෙ
ධීරෙන ලලාප සල්ලංපං - තං කරෙ තඥච රොචයෙ' ති
(චරියා පිටක අකි. ච.)

මහා බෝධිසත්ත්වයන් වහන්සේ විසින් ප්‍රාර්ථනා කරන ලද්දේ ඉහත ගාථාවෙහි සඳහන් පරිදි:
කලයාණ මිත්‍රයන් වහන්සේ නමක් දකින්ට ලැබේවා!
එවැනි කලයාණ මිත්‍රයන් වහන්සේ නමක් ගැන
අසන්නටත් ලැබේවා!
එවැනි කලයාණ මිත්‍රයන් වහන්සේ නමක් ආශ්‍රයට ලැබේවා!
එවැනි කලයාණ මිත්‍රයන් වහන්සේ නමක් සමඟ
කථා කරගැනීමට ලැබේවා!
එවැනි උතුමන්ගේ ආශ්‍රය භජනය උපදේශයම ඉතාමත්
ආදරයෙන් පිළිගන්නෙක් වෙම්වා!"

මෙම ග්‍රන්ථයෙන් දිස්වනුයේ ආදර්ශවත් කලයාණ මිත්‍ර මහෝත්තමයන් වහන්සේගේ ජයාරූප රැසකි. මේවා දෙනෙතින් දැකීමේදී නිතැතින්ම ඇති වනුයේ අසීමිත අනුසස්තානුත්තරියකි. සැබවින්ම සිල්වත් ගුණවත් උතුමන්ගේ දර්ශණය චිත්තප්‍රසාදයක්, චිත්ත ධෛර්යයක් දනවනුයේ බෝධිපාක්ෂික ධර්ම ශීර්ෂයෙනි. සසර කෙටිකරමින් නිවනට සමීප වෙමින් සසුන් පිළිවෙත් පිරීමෙහි නෙපමා වූ එම කලයාණ මිත්‍ර මහෝත්තමයාණන් වහන්සේලාට අපගේ ගෞරවාචාර උත්තමාංග නමස්කාරය පූජාවේවා! මෙය සංස්කරණය කළ සැමට අති උතුම් කලයාණ මිත්‍ර ගුණස්කාධය මුදුන්පත් වේවා!

"සතං සමාගමො හෝතු - යාව නිබ්බාන පත්තියා"

මෙයට, මෙතැති
අරියධම්ම










මෙය සත්‍ය පිටපත නොවේ. එය මෙසේ විය යුතුයි යන්න අපි හඟිමු. මෙය සත්‍ය පිටපත නොවේ. එය මෙසේ විය යුතුයි යන්න අපි හඟිමු. මෙය සත්‍ය පිටපත නොවේ. මෙය සත්‍ය පිටපත නොවේ.









මැණික්වල
වටිනාකම තේරුම්
ගත් අය, තමන් ළඟට
මැණික් එනතුරු බලා සිටින්නේ නැත.
බොහෝ ඈත මැණික් බිම් සොයා ගොස්
මැණික් හමුකර ගන්නා මහන්සිය සිතන්ට බැරි
තරම්ය. පිංකම්වල අගය තේරුම් ගත් ඥාණවන්ත අය පිං
මිණිරුවන් තමන් ළඟට එනතුරු පිංකම්වලට තමන්ට ආරාධනා
කරන තුරු බලා සිටින්නේ නැත. මහන්සිය-බැරිය-අමාරුය කියා
නොසිතා බොහෝ වෙහෙසිල්ලෙන් සොය සොයා ගොස් උදාර වූ අගනා පින්
මිණිරුවන් අත්පත් කර ගන්නේය. තමන්ගේ පුණ්‍ය නිධානය විසිතුරු කර ගන්නේය.





සෙක්කුවේ තල තැලෙයි. කුමකටද? තෙල් සඳහාය.

තල තැලී තෙල් මිරිකී එක් තැනක ගබඩා වෙයි. ඒ තෙල් රැස්වෙන තැනත් තැලෙන තැනත් එක්කොට සලකා බලන කල්හිය තල තැලෙන්න් මේ තෙල් සඳහාය යනු මැනැවින් වැටහෙන්නේය. සසුන පිහිට කොට අප මේ වෙහෙසෙන්නේ කුමටද? සන්තාන ධර්ම සඳහාය, තල තැලී තෙල් රැස්වන තැන මෙන් අප කරන පිංකම්වල ආනිසංස ඵලය අප දැනගත යුත්තේ අපේම ආධ්‍යත්මය දෙස බැලීමෙනි. පිංකමකින් ක්‍රම තුනක ආනිසංස සන්තානයේ හටගනී. රාගාදී කෙලෙසිලි තුනීවීම, සති ඤාණ ආදි බොජ්ඣඞ්ග ධර්ම වැඩී යාම, ප්‍රණීත කර්ම පරම්පරාවක් ජනිතවීම යන ක්‍රම තුන සන්තානය විසිතුරු කෙරෙන ආනිසංස ඵල වශයෙන් සැළකිය යුත්තේය. මෙසේ සිත දෙස බැලීමෙන් පිංකමක යථාර්ථය වටහා ගත යුත්තේ,

පුඤ්ඤන්ති රාගාදීනන්තු - පටිපක්ඛාහි චෙතනා
පඤ්ඤාදි ගුණ සංයුත්තා - විඤ්ඤෙය්‍යා සුඛ දයිකා

යනුද මෙහිලා සිහි කටයුතුය.











'අපේ වන්දනා පිරිස බුද්ධගයා ශුද්ධ භූමියට පැමිණියේ ඊයේ දවල් තුනට පමණය. මේ පොළොව ස්පර්ශ කිරීමේදී ජීවිතයට එක් වූ ප්‍රීතිය වැනි ප්‍රීතියක් වෙන මොනම බිමකදිවත් ලබන්නට බැරිය.
මේ ලෝක ධාතුවේ. මෙයට වඩා උතුම් තැනක් නැත.
ජය සිරි බෝ හෙවන යට වැටී අපි ඊයේ රාත්‍රී
මහා පූජාවක් පැවැත්වීමු.
හෙට උදේ රජගහනුවර බලා පිටත්වන්නෙමු.
18 වෙනිදා බැරණැසය.
22 වෙනිදා කුසිනාරාවේය.
23 වෙනිදා ලුම්බිණියේය.
24 වෙනිදා සැවැත් නුවරය.
මාර්තු 13 වෙනිදා වන්දනා ගමන නිමකොට
ආපසු පැමිණීමට හැකිවේ යයි සිතමි.

ධර්මය වරදවා ගත් ඇතැම් අය පිංකම් කිරීම මෝඩ කමකැයි සිතනු පෙනේ. මේ අය අතර දැනුමැත්තන් ද වීම සංවේගයකි. පටිච්ච සමුප්පාදයේ අවිජ්ජාපච්චායා සංඛාරා යන ධර්ම නියාමයේ හැටියට පිංකම් කිරීමත් මෝඩකමින් සිදුවන්නක් නොවේ දැයි දිනක් මගෙන් ප්‍රශ්න කළේය. මම ඒ අයට මෙය මැනවින් පැහැදිලි කර දුනිමි.

(පුඤ්ඤ) පින් යන වචනයෙන් පැහැදිලි වන්නේ සිත නිකෙලෙස් බවට පත් කෙරෙන චේතනා සම්පත්තියෙන් සැදීගත් විස්තරු ක්‍රියා පරපුරෙකි.

“පුඤ්ඤන්ති රාගාදීනන්තු - පයිපක්ඛාහි චෙතනා
පඤ්ඤාදි ගුණ සංයුක්තා - විඤ්ඤයපා සුබ දයිකා”

යන මේ ධර්ම විවරණයෙන් පිනේ ස්වලක්ෂණය මැනවින් වටහා ගත හැකිය. නිවන් දැකීමට පමණක් නොව නිවනින් මේ පිට පාරමී වාසනාව ඇති ජීවිත ලබා ගැනීමටත්, උපකාරීවන එකම දෙය පිනය. ඉතින් පින් නොකර සැනසුම ලබන්නේ කෙසේද? සසුන් පිළිවෙත එහෙම පිටින්ම සැලකිය යුත්තේ එකම පින් පෙරහැරක් ලෙසිනි. බෝසතාණන් වහන්සේලා සාතච්චකාරීව අතරක් නැතිව පාරමී පෙරහැර පැවැත්වූ සැටි අපි දනිමු. මේ පාරමී කියන්නෙත් වෙන දෙයක් නෙවෙයි. පැවැත් වූ නිස්සරණ ප්‍රාර්ථනාවෙන් කෙරෙන පින්කම්ය. පින්කම් කල යුතුමය. නිරන්තරයෙන් කරන පින්කම් අතර අවස්ථානුරූපව කාලික වශයෙන් යොදාගන්නා මේ පින්කම් පුණ්‍ය ප්‍රත්‍යාවේක්ෂණ අවස්ථා වශයෙන් සැලැකිය හැකිය.

දිරායන ශරීරයත්, ගෙවීයන කාලයත්, වෙන් වී යන බාහිර අයිතියත් දිරා-ගෙවී-වෙන්වී යද්දී අපි නොදිරණ, නොගෙවෙන වෙන් නොවන උතුම් ධර්ම සම්පත්තිය වඩමින් මහා සැනසිල්ලට පත්වෙමු.
මේ ලොවුතුරා සැනසිල්ලය.









මැණික පරිහරණය කරන්ට කරන්ට එහි අගයත් පැහැයත් වැඩි වෙනවා මිස අඩුවීමක් වන්නේ නැත. හොඳ අදහස් වලින් පිරුණු පොතක ස්වරූපයත් එබදුය. අප පොත් වල රසය විඳ විඳ සැනසෙමු. කොයි තරම් රසය වින්දත් පොතේ මිහිර අඩුවන්නේ නැත. සමහරවිට රස විඳින්නට විඳින්නට වැඩි වැඩියෙන් රස දැනී යන්නේ රස උල්පතක මහිමය පළකරමිනි.

ලොව පවත්නා පොත් අතර අගනාම විසිතුරු පොත වශයෙන් සැලකිය යුත්තේ ජීවිත පොතය. අනිත් පොත් වල ඇත්තේ පිටස්තර දේවල වෙනත් පුද්ගලයන්ගේ විවිධ වෘතාන්තනය, තොරතුරුය. අප එයින් ලබන්නේ ආගන්තුක රස වින්දනයකි. අපට ඒ බාහිර දේවලින්ද අගනා ආදර්ශ පාඩම් ලැබෙන බව ඇත්තය. හැබයි එය සාර්ථක වින්දනයක් වන්නේ තමන් ලියන ජීවිත පොතට එයින් වැඩ සලසා ගත්තොත් පමණය. නැතිනම් එය අනුන්ගේ නැටුමක් බලා සතුටුවීමේ ස්වරූපයට පත්වන්නේය. අභිඥාලාභීන්ට ජීවිත පොතේ පිටු පෙරල පෙරලා බැලිය හැකිය. නිවනට පත්වන තුරුම ජීවිත පොත ලියවෙයි. ජීවිත පොතේ අවසන් පිටුව නිවනය. රහතන් වහන්සේ ඒ අන්තිම පිටුව බල බලා සැනසෙන්නේ නිරෝධ සමාප්ත්ති වශයෙනි.

ගෙවීගිය දවස ජීවිත පොතේ ලියා අවසන් කළ පිටුවකැයි සිතමු. ලැබූ දවස ලියන්ට තිබෙන පිටුවය. ගෙවීගිය පිටු පෙරළ පෙරළා බලන විට ඇතිවන දර්ශනය ඊළඟ පිටු වැඩිය හොඳින් ලිවීමට ආසේවන වශයෙන් ප්‍රත්‍යය වන්නේය. ජීවිත සමාපත්ති වශයෙන් ජීවිත පොත බල බලා සැනසෙන්නටත් ඉදිරිගමනේ උනන්දුව වඩා ගන්නටත් පුරුදු විය යුතුය.






අපි නවත් අවුරුද්දක ගමන අවසන් කෙළෙමු. 1968 ඊයේ අවසන් විය. මේ දිනවල හඳට ගොස් ආපසු පැමිණි ගුවන් වීරයන් තිදෙනෙකු පිළිබඳ හඬ දස දෙසින් ඇසේ. හැතැප්ම ලක්ෂ ගණනක් ගුවනේ ඉහළට ගොස් පහළට බැස්ස මේ ගමනින් ඒ ගමන්කාරයන්ට වූයේ කුමක්ද? ඔවුන්ගේ කෙලෙස් වැඩිවිය. දුක් වැඩිවිය. සසර දික් විය. අමෙරිකාව ලෝක ජයග්‍රහණයක් කළ වග කියයි. එයත් බොරු නොවේ. මෙය නම් මහා සපන්කමක් බව ඇත්තය. හඳ ආසන්නයට ගොස්, හඳ දෙස බලා හඳවටේ කැරකී පණ බේරාගෙන නැවතත් මේ මහා පොළොවට අවතීර්ණ වීම නම් විශ්මිත ගමනක් බව සැබෑය. ඒ ලෞකික වශයෙනි. ලෝකෝත්තර වශයෙන් අනුමාත්‍ර වූ ද ශාන්තියක් මෙයින්ද ලද බවක් කිය නොහැකිය. ධර්මයේ ඇසින් බලන විට සැබවින්ම මෙය කෙලෙස් ගමනෙකි.

















අපින් ක්‍රමයෙන් වැඩිහිටියන් වෙමු. අපේ වැඩිහිටිකමේ ආධ්‍යාත්මය ඉතා විසිතුරුය. ලොව ඇති විසිතුරු දේවල අගය කාලයත් සමග හානභාගිය තත්ත්වයට පත්වෙයි. දැල්වෙන පහනේ විසිතුර, සුවඳ විහිදෙන මලක විසිතුර අපට පැහැදිලිය. ගෙවෙන මොහොතක් පාසා පහනේ එළියත් මලේ සුවඳත් අභාවයට යයි. නිවී ගිය පහණක, මැලවී ගිය මලක අගයක්






නැත. විසිතුරක් නැත. අප වැඩිහිටියන් වන්නේ වයසින් පමණක් නොවේ. ගුණයෙන් හා නුවණින්ද අපි වැඩිහිටියන් වෙමු. දිනෙන් දින පොහොර වැටී වැඩෙන සඳුන් ගසක් මෙන් අපේ ආධ්‍යාත්ම වැඩුමද නිරන්තරව සිදු වෙයි. අපේ ධර්ම වාසනාව මෙයයි. අපේ සැනසිල්ල එයයි    අප සංවර විය යුත්තේ ඒ සඳහාය.





අහසට නැගෙන සෑම වැහි වලාකුළකින්ම බින්දුවක් සීතාවකටත් ලැබෙනවාය කී කතාව මෙන් අපත් පෙළ ගැසෙන්ට ඕනෑ අප අතින් සිදුවන සෑම දෙයකින්ම බින්දුවක්වත් අපේ පාරමී සිතට එක්වන ලෙසටයි. අහසින් වැටෙන එක දිය බිඳක්වත් අපතේ නොහරින්නට අපේ පැරකුම්බා නිරිඳු වැඩ සැළසුම් කළාක් මෙන් අපේ ජීවිත සිද්ධි සියල්ල අපතේ යන්ට නොදී ලොවිතුරා සැනසිල්ලේ වැඩ බවට පාරමී වැඩ බවට පත්කර ගැනීම අපේ ශාන්ති පෙළ ගැස්ම විය යුතුය. මෙවැනි ධර්ම වාසනාවකි අද අපට ලැබී තිබෙන්නේ. අපි මේ ධර්ම සැපය-ධර්ම ප්‍රීතිය විඳ ගනිමින් මේ අප විඳින ධර්ම සැපය තව බොහෝ දෙනාට අත්වේවා යන ධර්ම ප්‍රාර්ථනා සිතට ඇති කර ගනිමු. වචන කථා කරමු. ඒ පැතුම් ක්‍රියාවට නගමු. එසේ ඇති කල්හි අපේ හුස්ම බින්දුව පවා ධර්මයෙන් මිහිරි වී ඇති සැටි අපට දැක ගත හැකිය. අපේ මුළු ජීවිතයම එකම මෛත්‍රී පෙරහැරක්ව පවත්නා සැටි දැක ගත හැකිය.







ශරීරයේ නිතර ඇතිවන දුබලකමක්, වයස් යාමෙන් ඇතිවන දුබලකමක් අතරට ලෙඩ සතුරා වැදගත්තාම අපායට හෙණ ගැසුවාය වැනි තත්වයකි ඇතිවන්නේ. මේ මොනවා වුවත් කරන්ට දෙයක් නැත. 'බහු දුක්ඛො බො අයං කායො, බහු ආදීනවො' යනු සිහි කරමින් මේ සියල්ල සත්‍යාවබෝධයට උපනිශ්‍රය කර ගැන්ම අපේ පෙල ගැස්ම විය යුතුය.

කය වෙනුවෙන් අප කරන සාත්තු අඬන ළමයෙකු නළවා ගැනීමට කරන ගීත ගායනයක් වැනිය. ගී හඬින් නැළවෙන දරුවා නින්දට වැටෙයි. නිදන තුරු නිසංසලය. නින්දෙන් අවදිවන්නේ අඬාගෙනය. අපේ කයත් මෙබඳුය. කය සමග අප කරන සටනේ දිනුම තාවකාලිකය. අප මේ කරන්නේ හැමදාම පරදින සටනෙකි. බෙහෙත් හේත් සාත්තු සප්පායම් විධිවලින්, නෑම් කෑම් නිදීම් හිඳීම් ආදී සංග්‍රහයෙන් අප අතරත් නැතිව පවත්වන කායික තේවව නිස්සාර කයක් ලබා ගැනීමේ වරදට විඳින දඬුවම් වැනිය. එක් අවස්ථාවක නකුල ගෘහපතියාට බුදුරජාණන් වහන්සේ වදාළේ මේ කය එකම ලෙඩක් වශයෙනි. හැබැයි එය කවදාවත් සනීපවෙන්නේ නැති ලෙඩකි. සමස්ත සත්ව ලෝකයාම නිරන්තරයෙන් යෙදී සිටින්නේ 'කය' නමැති ලෙඩේට බෙහෙත් සැළසීමේ පුදුම සටනකය. තනිකර කය එල්ලේ සටන් කිරීමෙන් දිනූ කෙනෙක් ලොව නැත. දිනන්නට නම් කයත් අත්වැල් කරගෙන හිත හැදීමේ-වැඩීමේ ශාන්ති ක්‍රියා නොතොරව සිදු කළ යුතුය. අප අහාරපාන ගන්නේ අඟ උදෙසා බව සැබෑය. මේ ගන්නා ආහාර පාරමී වතක් වේවා! දුක් ඉවර කර ගැනීමේ වැඩට නිශ්‍රය වේවා! යන හැඟීමෙන් යුතුව ආහාර ගන්නවා නම් පිඬක් පාසා සිතටද එක්තරා ජීවයක් ඇතිවන්නේය. කයට හැදෙන පණ දිරායන නමුත් මේ ධර්මය වූ සිතේ වැඩුම දිරන්නේ නැත. අද අපට ලැබී තිබෙන ධර්ම වාසනාව මෙබඳුය.





අපේ මේ ශාසනික වැඩ පිළිවෙල ස්ථාවර භාවයට පත්කර ගැනීමම ශාසනය බේරා ගැනීමේ අසහාය තත්ත්වය වශයෙන් කල්පනා කටයුතුමය. පොළොන්නරු යුගයේ පටන් වේගයෙන් ශාසනය පිරිහෙන්නට පටන් ගත්තේ භික්ෂූන් බාහිර වැඩට බැස ක්‍රියා කරන්නට වීම නිසයි. ආරණ්‍යයේ වැඩ සිටිය දිඹුලාගල කාශ්‍යප හිමියන් වැනි මහා ගුණවතුන් ආරණ්‍ය ප්‍රතිපත්ති වලින් වෙන්කොට සමාජ සේවා වැඩවලට යොදා ගත්තේ ප්‍රබල ගිහි දායක පක්ෂය විසිනි. එයින් ආරණ්‍ය වැසී ගියේය. ප්‍රතිපත්ති ශාසනය පිරිහී ගියේය. කොයිතරම් පිරිහුණාද?

අවුරුදු හාරසීයයක් තුළ එකද උපසම්පද භික්ෂුවක් නැති තැනට ප්‍රතිපත්ති ගිලිහී වැලිවිට සංඝරාජ හිමියන්ගේ කාලය වන විට එකම උපසම්පද නමක්වත් සිටියේ නැත. පොළොන්නරුවෙන් පටන්ගත් ප්‍රතිපත්තියේ බැස්ම කොතෙක් මහත්දැයි එයින් තේරුම් ගත හැකිය. සමාජ සේවා වැඩට යොමුවන්නේ පිරිසිදු සිතිනි. එහෙත් නොදැනීම වාගේ නොනිසි තැනට ඇදීයාම වළක්වන්නට බැරි දෙයකි. දිඹුලාගල කාශ්‍යප හිමියන් මෙයට හොඳම නිදසුන වශයෙන් දැක්විය හැකිය. රජුගේ ආරධනාවෙන් උන්වහන්සේ ආරණ්‍යයේ කටයුතු වලින් වෙන්ව







සාමාන්‍ය වැඩට යොමු වූයේ ඉක්මණින් ආරණ්‍යයට වඩින අදහසිනි. එය සිදුවූයේ නැත. වැඩ වැඩි විය සැළකිලි වැඩි විය. එයින් බැඳීගිය උන්වහන්සේට නැවතත් ආරණ්‍යයට වඩින්නට බැරි විය. වැලිවිට සංඝරාජ හිමියන් බලවත් උත්සාහයෙන් උපසම්පදාව පිහිටුවා ශාසනය නගා සිට වූ නමුත් වැඩිකල් යන්නට මත්තෙන් ඇද වැටී ගියේ බාහිර දේවල යෙදෙන්නට භික්ෂූන්ට දොරටු තැබීම නිසයි. මේ වැටී ගිය ශාසන තත්ත්වය නගා ගැනීමටමයි. මේ අපේ වැඩ පිළිවෙල පටන් ගත්තේ.

බාහිර දේවල පැටලෙන්නට යාම මේ වැඩ වලට මහත් අවහිරයක් බව ඒ වැඩ කලක් තිස්සේ කිරීමෙන් මට ප්‍රත්‍යක්ෂ විය. මම පත්‍ර වලට ලියුම් ලීවෙමි. රෑ දවල් නොබලා බොහෝ වෙහෙසී තැන් තැන්වල ගොස් ධර්ම දේශනා කෙළෙමි. ඒවායින් ප්‍රතිඵල නැතැයි නොකිය හැකිය හැකි වුවත් මේ අප පටන් ගත් වැඩට ඒවා අවහිර වශයෙන් මට පෙනී ගියේය. නිශ්ශබ්දව විවේකීව ආධ්‍යාත්මිකය වැඩුමේ වැඩ කළයුතු යයි සිතා ගත්තේ එහෙයින.





මේ මාරයාගෙන් බේරීමටය. මාරයා නොඑන ලෙස අහස වසන්නට අපට නොහැකිය. මාරයාට ඇඟිලි ගැසිය නොහැකි සේ, මාර විගඩම් නොපෙනෙන-නොදැනෙන සේ අපි අපේ සිත රැක ගනිමු. මාරයා ඕනෑ නෙයියාඩමක් කරපුවාවේ. අපි අපේ පිංකම කරමු. ඒ සසුන් මෙහෙවරේ මහා ප්‍රීතිය මාරයා බලා සිටිද්දී විඳගන්නට අපි යෝධ සන්නාහයෙන් සැරසෙමු.


මේ කියන්නේ සර්වඥයන් වහන්සේගේ මහා කරුණා මුහුණ දෙස බලාගෙනය.

ගිහි වුවත් පැවිදි වුවත් ජීවිතයක අවසානය මරණයයි. අප මේ සියල්ල කරන්නේ ඒ මොහොත වනතුරුය. තමන් කළ හොඳකම විනා ඒ අවසාන මොහොතේදී වන මොනම දෙයකින්වත් සැනසෙන්නට බැරිය. නොයෙක් දැඟලිලි වැඩවල යෙදී සිටින අපේ බොහෝ දෙනා මෙය සළකන්නේ නැත.
















ආදාහරණයට පෙර දින ඒ නමට අයිති දේවල් ගැන සෙවීමු. තුබුණේ ඒ ඒ දේ ලියූ දින සටහන් පොතක් පමණය. මෙය හැබෑ පැවිදි ජීවිතයේ ආදර්ශී යයි. සංගාරව බමුණාට භික්ෂු ජීවිතය පැහැදිලි කොට දෙසූ ධර්ම දේශනාවකදී, භික්ෂුව අකිංචන යයි වදාළ සේක. අකිංචන නම් බැඳිලි නැති-කිසිවක් නැති යන තේරුමය.

අවසාන සිතට මෙබඳු නිදහසක් ගිහි පැවිදි කාටත් ඇතිකර ගැනීම අවශ්‍යය. භික්ෂුව නම් එසේ විය යුතුමයි.











රන් හුයක ඇමිණිය යුත්තේ අගනා මුතු මැණික්ය. බොරලු කැට හෝ ඔලිඳ-මාර ඇට වැනි පහත් පංතියේ දේවල් රංහුයක ඇමිනීම යුතු නෙවේ. මොන ලෙසකින්වත් නවතා ගැනීමට බැරි ලෙස නිරතුරුව ගෙවී දිරා යන මේ ජීවිතයේ හැබෑ නතු මැනවින් වටහා ගත් භාවිත වාසනාව ඇති ධර්ම ප්‍රාර්ථනා බද්ධ පුද්ගලයෝ නො ගෙවෙන නො දිරණ ජීවිත සම්පත්තියක් ඉදිකර ගනිති. එය ආමිස වශයෙන් නොවේ. නිරාමිස ධර්ම සම්පත්තියක් වශයෙනි. ධර්මයය රැකෙන කඳවුරු වන්නේ එබඳු මහාත්ම පුද්ගල සන්තානයයි. කාල යාත්‍රා කළ උදාර ගුණ යුත් මහත්මාගේ නැති වී ගියේ භූත කාය මාත්‍රය පමණයි. ඒ සත්පුරුෂ මහත්මා විසින් ඉදිකළ ගුණ ශරීරය නැසුනේ නැත. ඒ සදනුස්මරණීය ගුණ ජීවිතය මට දැනෙන්නේ ඉතා පිරිසිදු දඹ රන් හුයක් ලෙසිනි. ඒ හොඳ නාමය නැමැති රන් හුයේ අමුනන්ට ඕනෑ මැණික් සේ උජ්ජ්වලිත පිංකම්ය, එසේ කිරීමයි කෘතඥතා ගුණ අනුස්මෘතියක් වෙන්නේ.







ගස් අතර අරටු ගස් විරලය. කාර්මිකයන් අතර දක්ෂයන් දක්නට ලැබෙන්නේ කලාතුරකිනි. පුද්ගලයන් අතර භාවිත වාසනාව ඇති මැණික් වැනි විසිතුරු පුණ්‍යාත්මීන් මුණ ගැසෙන්නේ දහසකින් කෙනෙකි. ඊට ඔබ දුක් විය යුතු නොවේ. බොරලු කන්දට එළිය දෙන අගනා මිණි රුවනක්සේ දුලබ මිනිස් ගුණයෙන් හෙබි එක් පුද්ගල රත්නයකින් දහස් දෙනාට එළිය ලැබෙන සැටි සිහි කරන්න.

සැඟවී ඇති පුද්ගල වාසනාව මතුකර පහන් වැනි මැණික් වැනි කලණාණයන් පේළිකර ගැන්ම හොඳ හිතේ පෙරහර විය යුතුය. අප විඳගන්නා ධර්ම සැපය තව බොහෝ දෙනාට විඳගන්නට සැලසීම අපේ මෛත්‍රී පිළිවෙත විය යුතුය. පුද්ගල අඳුරෙන් දුක් වීම හිත ආතුර කර ගැනීම නොව ඒ අඳුරු තැන්වලට එළිය දීම අපේ කරුණා මෙහෙවර විය යුතුය. මානසික ලෙඩින් පෙළෙනවුන්ගේ ඒ ලෙඩ සුවකර ගැන්මට උදවුවනු මිස ඔවුන්ගේ කෙඳිරියට අත්වැල් වීම අපේ ඥාණ පිළිවෙත නොවිය යුතුය.

ලොවුතුරා බුදුගමන අපේ සැනසිලි ගමනේ ආදර්ශ මාර්ගය විය යුතුය. බුදු එළිය අපේ සැනසිලි පිළිවෙතින් නොනිවෙන ආලෝකය විය යුතුය. නැණ එළිය විහිදුවා කරුණාවෙන් විසිතුරුව නොකඩවා පැවැත්වූ ඒ අසිරිමත් බුදුගමනට බුදුපෙරහරට අපි හැම අනුයාත වෙමු.





ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ වත්මන් ප්‍රධාන සභාපති අතිගරු පූජ්‍යනීය මිනුවන්ගමුවේ නාගිතාභිනන්දාන මාහිමිපාණන් වහන්සේගේ ඡායා රූපයක් පලමුව දැක්වෙන අතර ඉහලින් දැක්වෙන ඡායා රූපයේ මූලාසනයේ වැඩසිටින්නේ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ වත්මන් මහානායක ධූරය දරන අතිගරු පූජ්‍යනීය වේවැල්දෙනියේ මේධාලංකාර මහානායක මාහිමිපාණන් වහන්සේය.





## අපේ මේ බිම බුදු බිමෙකි!

බුදු රැස් වතුරෙන් නැහැවී ඇති පිවිතුරු බවට පත් ලක් පොළවේ සෑම වැලි කැටයක්ම මැණික් මෙන් අමිල අගයෙන් යුක්ත සේ දැනෙයි. බුදු සසුන රැක ගැනීමේ විවරණය ලැබූ අපේ ජාතියත් දරුවෙක් පහළ වෙන්නේ ශාසන වස්තුවක් වශයෙනි. සිංහල මවගෙ කුසෙහි පිළිසිඳ ගන්නා දරුවාට බුදුගුණ කවා බුදුඑළිය ඒ පින්වත් දරු ජීවිතයට එක්කරන්නේ මෙලොව එළිය දකින්නට මත්තෙන්මය. එකට පේළි කළ නොනිවෙන පහන් පෙලක් සේ අපේ ජාතිය එකට පේළි වී බුදු පෙරහැර කළ සැටි, බුදුසසුන රැකගත් සැටි අපි දනිමු. මේ පොළවේ හටගත් සෑම ගහක් ගලක්ම සසුනට සෙවන දුන් සැටි අපට සිහිකළ හැකිය.

සසුන් මිහිර කැවුණු ඒ වන සෙනසුන් අඳුරෙන් යට වී ගත්තා සේ සසුන රැක ගත් ජාතියද දුර්දශාපන්නව සිහිසන් නැතිව ගිය තත්ත්වයට වැටී ඇත. අද කළ යුත්තේ සසුන් එළියෙන් අප එළිය වී සසුන් මිහිරෙන් අප මිහිර වී මේ අඳුරෙන් වැසී ගත් තැන් එළිය කර ගැනීමේ උදාර මෙහෙවරට පිරිසිදු කරුණාවෙන්ම පෙරමුණු වීමයි. මෙයට සුදුසු කල්‍යාණශීනලීන් තවම අපට මදිය. කෙසේ නමුත් අපි නොනැවී නොපසුබැස ඉදිරියටම යමු. සසුන රැක ගැනීමට සුදුසු පුණ්‍යකාමීහු සිය ගණනින් අපේ පෙරහැරට එක්වෙන්වා!


















පසුගිය අළුත් අවුරුදු දවසේ (අප්‍රේල් 14 වෙනිදා) මෙහි අපේ නමලා රැස්කොට මම අවුරුදු අනුශාසනාවක් පැවැත්වීමි. මේ නමලා අළුත් අවුරුද්දට වැඩ පටන් ගන්නේ කොහොමද? කියා විමසමිනි මගේ අනුශාසනාව මුල පිරුවේ. පළමුකොට මම වැඩ පටන් ගත් හැටි පැහැදිලි කෙලෙමි. එදින (අවුරුදු දා) අලුයම මම බණ පොතක් අතට ගතිමි. ඒ මැදුන් සඟි පොත්වහන්සේය. මැදුන් සඟියේ සූත්‍ර 152 ක් තිබෙනවා මේ අවුරුද්ද තුළ මැදුන් සඟිය සහමුලින් මට පුගුණ කර ගන්ට හැකිවේවා යන අධිෂ්ඨානයෙන් යුතුව මම පොත පෙරලුවෙමි පොතේ 152 වෙනි අන්තිම සූත්‍රයයි පෙරලුණේ. ඒ අන්තිම සූත්‍රය ඉන්ද්‍රිය භාවනා නම් වෙයි.

1 අනුත්තර ඉන්ද්‍රිය භාවනා
2 සෙඛ පටිපදා
3 භාවිතින්ද්‍රිය,

යනුවෙන් කොටස් තුනකින් යුක්ත කොට අර්හත්වය දක්වා ඉන්ද්‍රිය සංයමය විය යුතු සැටි පැහැදිලි කොට බුදුරජාණන් වහන්සේ වදාළ මේ ධර්‍ම විස්තරය තේරුම් ගැනීමේදී ධර්‍ම ප්‍රීතියෙන් සිත පිනා ගියේය. 151 වෙනි සූත්‍රය පිණ්ඩපාත පාරිසුද්ධි නම් වෙයි. එය ද කමණීය ධර්‍ම විවරණයෙකි. 149 වෙනි මහා සළායතනික සූත්‍රය අවර්ජීය ධර්‍ම නිධානයෙකි.


මේ අජර, අමර ජීවිත වාසනාව යාව නිබ්බාණ වේවා!
අපි අපේම ජීවිත භවනාවට නගමින් අපේම විසිතුරු පෙරහැර
දකිමින් සතුටු වෙමු. සැනසෙමු. නොනැවතී ඉදියට යමු. නිවන් දක්වා යමු.

# පසු වදන...

## ආත්ම ප්‍රත්‍යවේක්ෂණ

ශ්‍රීමත් සම්බුද්ධත්ව 2600 ජයන්තිය සිහිපත් කරමින් ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව පිහිටුවා වසර 60ක් සපිරීම නිමිති කෙරෙන මෙම ඡායාරූප ඇතුලත් වටිනා ග්‍රන්ථය සඳහා පූජ්‍ය ගංගොඩවිල අරියගවේසී ස්වාමීන් වහන්සේ මහඟු වෙහෙසක් දරා කටයුතු කොට ඇති බව පෙනේ.

මහ බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත් වී වසර 2600 ක් සපිරීම මුල් කරගෙන රට පුරා මහා පිංකම් රාශියක් සිදුවිය. ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව එකතු වී මහා පිංකම් මාලාවක් අනුරාධපුර රුවන්වැලි මහා සෑ මළුවේදී සිදු කිරීමට (2011 ජූනි 04) සූදනම්ය. ඒ වෙනුවෙන් මෙම ආත්ම ප්‍රත්‍යවේක්ෂණ නම් ග්‍රන්ථය නිකුත් වේ. අපවත්වී වදාළ අතිගරු රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශාභිධාන නායක මාහිමිපානන් වහන්සේගේ ඡායාරූප සමඟ උන් වහන්සේගේ ලිපි වල ඇති වටිනා අදහස් උපුටා දක්වමින් ද නවද සංඝ පීතෘන් වහන්සේලාගේ ඡායා රූප ඇතුලත් කරමින් ද මෙම පොත සකස් වී ඇත.

නැවත නැවත නුවණින් සිතා සතුටුවීම යන අර්ථය ආත්ම ප්‍රත්‍යවේක්ෂණය යන නමින් ප්‍රකාශ වේ. ඡන්ද චිත්ත, වීරිය, විමංශා යන ධර්‍ම මුල් කරගෙන සියලු ප්‍රත්‍යවේක්ෂණ සිදුවේ. එම කරුණු හතර මුල් කරගෙන කරනු ලබන සියලු දේ සාර්ථකය, මනෝහරය. අපවත්වී වදාළ අතිගරු කඩවැද්දුව මාහිමිපාණන් වහන්සේ එම කරුණු හතර මුල් කරගෙන කටයුතු කලහ. එසේම ඉවසීම, කරුණාව, මෛත්‍රිය, නිහතමානී බව, අවංකබව, උත්සාහය, නුවණින් කටයුතු කිරීම ආදී ගුණයන්ගෙන් පිරිපුන් ජීවිතයක් විය. උන් වහන්සේට බුදුබව ප්‍රාර්ථනා කරමින් මෙම සමරු පොත නිකුත් කෙරේ.

අපවත් වී වදාල අතිගරු මාතර ශ්‍රී ඤාණාරාම මාහිමිපානන් වහන්සේ, අපවත් වී වදාල අතිගරු ගැටමාන්නේ ශ්‍රී විමලවංශ මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන අපවත් වී වදාළ සියලු ස්වාමීන් වහන්සේලාට නිවන් සැප ලැබේවා.

අති පූජ්‍ය මිනුවන්ගමුවේ නාගිතාභිනනධාන ප්‍රධාන සභාපති මාහිමිපාණන් වහන්සේටද, අති පූජ්‍ය නාඋයනේ අරියධම්මාභිධාන මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේටද, යෝගාශ්‍රම වාසි සියලු සංඝරත්නයටද නිරෝගී සුව දිගාසිරි ප්‍රාර්ථනා කරමි.

මෙම ග්‍රන්ථය සංස්කරණය කළ පූජ්‍ය ගංගොඩවිල අරියගවේසී ස්වාමීන් වහන්සේටද, මුද්‍රණ වියදම් දරූ ----- ------------ පිංවතුන්ලාටද නිරෝගී සුව දිගාසිරි පතමි.

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව බුද්ධ සාසනාත්තය දක්වාම ලොව පවතීවායි ආශිංසනය කරමි.

මෙයට
කාරුණික
පූජ්‍ය කහගොල්ලේ සෝමවංශ ස්ථවිර,
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා මූලස්ථානය
ගල්දූව ආරණ්‍යය සේනාසනය,
අම්බලන්ගොඩ.
2011.05.20

## තුති මල්...

**ආත්ම ප්‍රත්‍යවේක්ෂණීය මෙම සත් ක්‍රියාවේ බර දැරූ මහත්සේ කැපවූ සත්පුරුෂ මණ්ඩලය**

රුවන් රාජපක්ෂ මහතා හා හේරත් මහතා
Q & E ඇඩ්වර්ටයිසින් ආයතනයේ - ආසිරි අබේරත්න මහතා හා චමින්ද විජේවර්ධන මහතා
රොමේෂ් විජේනායක මහතා හා රුවන්දනී විජේනායක මහත්මිය
සමීර දසනායක මහතා හා අෂ්වින් හෙම්මාතගම මහතා
Softwave ආයතනයේ - සුරේෂ් පෙරේරා මහතා

ඇතුලු කුඩු මහත් අයුරින් මේ සමඟ සහසම්බන්ද වූ සත්පුරුෂ ඔබ හැමට
කෘතවේදීව පුණ්‍යානුමෝදනා කරන්නේමු!

---

© ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව

2011, ජූනි මස

ISBN: 978-955-0683-00-0

**ඡායා රූප, පිටු සැකසුම හා නිර්මාණකරනය:**
**Q & E ඇඩ්වර්ටයිසින් ආයතනය, චමින්ද විජේවර්ධන මයා.**
**මුද්‍රණය: ගුණරත්න මුද්‍රණාලය, මරදාන, කොළඹ.**

**ප්‍රකාශනය:** ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථානුබද්ධ
උල්පත්කන්ද ආරණ්‍ය සේනාසන
හන්තාන, මහනුවර.

9 78 95506 83000 0



2600 වන ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය හා සබැඳිව
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සම සැට වස් පූර්ණය සැමරුම

# ස්වර්ණමාලී

# මහා ථූපාභිවන්දනා

2011 ජුනි 04

ශ්‍රී කළ්‍යණී යෝගාශ්‍රම සංස්ථානුබද්ධ
උල්පත්කන්ද ආරණ්‍ය සේනාසන, හන්තාන, මහනුවර.

www.buddhistmonastery.asia